**2014 වර්ෂය සඳහා**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ**

**කාර්ය සාධන වාර්තාව**

**ආචාර්ය ඒ.ජේ. සතරසිංහ**

**අධ්‍යක්ෂ ජනරාල්**

தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களத்தின்

**2014** ஆம் ஆண்டுக்கான

செயலாற்றுகை அறிக்கை

கலாநிதி ஏ.ஜே. சத்தரசிங்க

பணிப்பாளர் நாயகம்

# PERFORMANCE REPORT
# OF THE
# DEPARTMENT OF CENSUS AND STATISTICS
# FOR THE YEAR 2014

**Dr. A.J. Satharasinghe**

**DIRECTOR GENERAL**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන්නේ රජයට සහ වෙනත් දත්ත භාවිතා කරන්නන් හට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා ප්‍රචලිත කිරීමයි. මෙරට ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථීක තත්වයන්ගේ විවිධ අංශයන්හි දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ වගකීම ඇතුළුව සංඛ්‍යාන සේවයේ අවශ්‍ය වන්නා වූ රාජ්‍ය ආයතන සඳහා වෘත්තීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ හා අනුයුක්ත කිරීමේ කටයුතු ද එයට පැවරී ඇත. එයට අමතරව සංඛ්‍යාන කටයුතු සඳහා සහාය අවශ්‍ය ආයතනයන් සඳහා සංඛ්‍යාන උපදේශන සේවාවන් ද එමඟින් ලබා දෙයි.

ගත වූ වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් භාරගත් බොහෝ කාර්යයන් ඉතාමත් සාර්ථක අයුරින් නිම කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ඉකුත් වර්ෂයෙහි ආරම්භ කළ කාර්යයන් තව දුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට බලාපොරොත්තු වන අතරම 2014 වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කල දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. එසේම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහයෝගය දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන වෙත මෙන්ම මහජනතාව වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.




ආචාර්ය ඒ.ජේ. සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"සංඛ්‍යාන මන්දිරය"

අංක 306/71, පොල්දූව පාර

බත්තරමුල්ල

| | |
|---|---|
| දුරකථන අංකය | : +94 11 2147001 |
| ෆැක්ස් | : +94 11 2147011 |
| විද්‍යුත් ලිපිනය | : dgcensus@statistics.gov.lk |
| වෙබ් අඩවිය | : www.statistics.gov.lk |

පටුන

පිටුව


**1. හැඳින්වීම**

**2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්**

**2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ**

2.1.1 ජන හා නිවාස සංගණනය - 2012
2.1.2 ආර්ථික සංගණනය - 2013/14
2.1.3 ගැටුම් හේතුවෙන් අවතැන් වූවන් පිළිබඳ සංගණනය - 2013
2.1.4 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය
2.1.5 ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍යය සමීක්ෂණය - 2014/15
2.1.6 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2012/13
2.1.7 ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය
2.1.8 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය
2.1.9 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය
2.1.10 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛයිමාසික සමීක්ෂණය - 2014
2.1.11 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය- 2014
2.1.12 පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය

**2.2 මෙරට සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ දත්ත එක්රැස්කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් කෙරුණ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු**

2.2.1 වී පිළිබඳ සංඛ්‍යාලේඛන
2.2.2 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන හා සත්ව සංඛ්‍යාති
2.2.3 කෘෂිකර්ම නිෂ්පාදන පරිමා දර්ශකය
2.2.4 ජාතික ගිණුම්
2.2.5 කොළඹ පාරිභෝගික මිල දර්ශකය(CCPI) - (පදනම 2006/07 = 100)
2.2.6 නිෂ්පාදක මිල දර්ශකය (PPI)
2.2.7 සිල්ලර හා නිෂ්පාදකයාගේ මිල ගණන්
2.2.8 ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI)
2.2.9 පලාත් පාලන සංඛ්‍යාති
2.2.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු
2.2.11 පුහුණු කටයුතු
2.2.12 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු
2.2.13 ප්‍රකාශන කටයුතු
2.2.14 මුද්‍රණ කටයුතු
2.2.15 සිතියම් විද්‍යා කටයුතු
2.2.16 දත්ත නිකුත් කිරීමේ කටයුතු
2.2.17 පුස්තකාල සේවා
2.2.18 ක්ෂේත්‍ර කළමණාකරන කටයුතු

**2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු**

2.3.1 වාර්ෂික රැකියා සමීක්ෂණය
2.3.2 සාමාන්‍ය ඉපයීම් සහ වැඩ කරන කාලය පිළිබඳ සමීක්ෂණය
2.3.3 පඩි පාලක හා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම
2.3.4 අධ්‍යාපන සංඛ්‍යාති
2.3.5 වෛද්‍ය සංඛ්‍යාති
2.3.6 ජීව සංඛ්‍යාති
2.3.7 ධීවර සංඛ්‍යාති
2.3.8 රේගු සංඛ්‍යාති

**3. පරිපාලනය**

**3.1 ප්‍රධාන අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල**

3.1.1 අංශ සහ ඒකක
3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල
3.1.3 දිස්ත්‍රික් කාර්යාල
3.1.4 පළාත් සභාවන්හි සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

**3.2 කාර්ය මණ්ඩලය**

**3.3 සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම - 2014**

**3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්**

**3.5 අභ්‍යන්තර විගණන කටයුතු**

**4. මූල්‍ය වාර්තාව - 2014**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2014

## 1. හැඳින්වීම

මෙරට සමාජ ආර්ථික තත්වයන්ට අදාල දත්ත එක්රැස්කිරීම, සකස්කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රචලිත කිරීමේ වගකීම පැවරී ඇත්තේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවටයි. ජාතික සැලසුම් හා රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම සහ එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ ඇතුලු විවිධ මාර්ග වලින් ලබා ගන්නා දත්ත අනුසාරයෙන් නොයෙකුත් විෂයයන් සම්බන්ධයෙන් නොකඩවා දත්ත සැපයීමෙන් දේශීය මෙන්ම විදේශිය සංවිධානවල දත්ත අවශ්‍යතා ද සපුරන ලදී. දෙපාර්තමේන්තුව විසින් රැස්කරනු ලබන දත්ත ජනගහනය, කෘෂිකර්මය, වෙළෙඳාම, කර්මාන්ත, මිල ගණන් හා ජාතික ආදායම් ආදී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය කරයි.

### දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

### මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

## 2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්

දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලබන කාර්යයන් පුළුල් වශයෙන් පහත දැක්වෙන කොටස් තුනට බෙදිය හැක.

2.1 දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

2.2 මෙරට සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ දත්ත එක්රැස්කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කෙරුණ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

2.3 ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මඟින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

## 2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.1.1 ජන හා නිවාස සංගණනය - 2012

ජන හා නිවාස සංගණනයේ සමස්ත ශ්‍රී ලංකාව සඳහා වූ වගු සියල්ල සකස් කර අවසන් වී ඇති අතර ඒ සියළුම වගු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇත. මෙම සංගණනයට අදාල පළාත් මට්ටමේ වාර්තා දෙකක් හැර ඉතිරි පළාත් හතේ වාර්තා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති අතර දිස්ත්‍රික් මට්ටමේ වාර්තා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම සඳහා මේ වන විට පිලියෙල කරමින් පවතී.

පරිලෝකනය කරන ලද සංගණන උපලේඛන වල 5% නියැදියට අදාල වෘත්තීය සුදුසුකම්, රැකියා හා කර්මාන්ත සඳහා කේත යෙදීම අවසන් වී ඇති අතර එම නියැදි වාර්තාවේ සංස්කරණ කටයුතු අවසන් කොට මුද්‍රණය කරවා දත්ත භාවිතා කරන්නන් අතර බෙදා දෙන ලදී.

## 2.1.2 ආර්ථික සංගණනය - 2013/14

ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනා ගැනීමට කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි 2013/14 වර්ෂ වලදී ආර්ථික සංගණනය පැවැත්වීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදී.

**කෘෂිකර්ම අංශය**

කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස්කිරීම අදියර දෙකකින් සිදු කරන ලදී. කෘෂිකර්ම සංගණනයට අදාලව අක්කර 20 ට වැඩි වතු ලැයිස්තු ගත කිරීමේ කටයුතු පසුගිය 2013 වර්ෂයේදී සිදු කරන ලද අතර ඒ සඳහා වූ වාර්තාවක්ද එළි දක්වන ලදී. මෙම සංගණනයේදී කෘෂිකර්මාන්තයට අදාල සියළුම ඒකක පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර එම තොරතුරු අතර විශාල ගොවි කාණ්ඩ, කුඩා ගොවි කාණ්ඩ හා වතු ආවරණය වන පරිදි ගොවිකාරකයින්, ගොවි කාරකයාගේ ගෘහ කාණ්ඩ පිළිබඳ, ඉඩම් භාවිතය හා භුක්තිය, ඒ ඒ බෝග යටතේ වගාකොට ඇති බිම් ප්‍රමාණය, මිරිදිය/කිවුල් දිය/කරදිය මත්ස්‍ය වගාවන් ආදී විෂයයන්ට අදාල තොරතුරු රැස් කරන ලදී.

තවද මෙම අදියරේදී ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුල පවතින කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල පහසුකම්, වෙළඳපොළ, කෘෂිකර්ම ව්‍යාප්ති සේවා ආදිය පිළිබඳ තොරතුරු විශේෂ ප්‍රශ්නාවලියක් භාවිතයෙන් රැස් කළ අතර තෝරා ගත් ගෘහ ඒකක 28,000 ක නියැදියක් සමීක්ෂණයට භාජනය කොට ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ තොරතුරු රැස් කරන ලදී.

මෙම අදියරේදී රැස් කරන තොරතුරු භාවිතයෙන් පිළියෙල කරන වාර්තා අවස්ථා කිහිපයකදී නිකුත් කිරීමට නියමිතය. ක්ෂේත්‍රයේ දත්ත රැස් කරන අවස්ථාවේ පිළියෙල කරන ලද සාරාංශ වාර්තා ඇසුරෙන් මූලික වාර්තාවක් සැකසීමේ කටයුතු දැනට සිදු කරමින් පවතී. එමෙන්ම රැස්කර ගත් තොරතුරු භාවිතයෙන් විස්තරාත්මක වාර්තාවක් දත්ත සැකසීමෙන් පසුව ප්‍රකාශයට පත් කරන අතර ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සංඛ්‍යාති ප්‍රකාශයට පත් කිරීමක් එමඟින් සිදු කරනු ලැබේ. ඒ අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව, ගොවි කාරකයින් සංඛ්‍යාව, එක් එක් බෝග වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය, කෘෂිකර්ම නිෂ්පාදන එක් රැස් කරවීමේ පහසුකම්, ආහාර තොග පවත්වා ගැනීම ආදී සංඛ්‍යාති ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙම වාර්තාව පිළියෙල කිරීම සඳහා ක්ෂේත්‍රයෙන් රැස්කළ තොරතුරු පරිලෝකනය කිරීමේ කටයුතු 2015 ජුනි මාසය වන විට නිම කිරීමට අපේක්ෂිතය.

**කර්මාන්ත අංශය**

ආර්ථික සංගණනයේ කර්මාන්ත, වෙළඳ හා සේවා අංශයට අදාල දත්ත රැස් කිරීමේ කටයුතු, ආර්ථික ඒකක ලැයිස්තු ගත කිරීම හා එම ඒකක වල තෝරා ගත් නියැදියක් මඟින් විස්තරාත්මක දත්ත රැස් කිරීම යන අදියර දෙකකින් 2014 වර්ෂයේදී සිදු කරන ලදී.

ආර්ථික ඒකක ලැයිස්තු ගත කිරීම යටතේ;

I. ලැයිස්තුගත කරන ලද ආර්ථික ඒකක කේත කිරීම
II. ආර්ථික ඒකක වල කේත පරීක්ෂා කිරීම
III. ආර්ථික ඒකක වලට අදාළ දත්ත පරිගණක ගත කිරීම
IV. ආයතන ලැයිස්තුවෙහි නිවැරදිතාවය පරීක්ෂා කිරීම

V. ලැයිස්තුගත කිරීමේ අදියරට අදාළ වාර්තාව සඳහා වගු ආකෘති පිළියෙල කිරීම

යන කාර්යයන් සිදු කරන ලද අතර, විස්තරාත්මක දත්ත රැස්කිරීමේ අදියරේදී;

I. ප්‍රශ්නාවලි සහ ඒ සඳහා උපදෙස් පොත් සකස් කිරීම
II. දත්ත භාවිතා කරන්නන් කැඳවා ඔවුන්ගේ දත්ත අවශ්‍යතා හඳුනා ගැනීම
III. ප්‍රශ්නාවලි වල යෝග්‍යතාවය හඳුනා ගැනීම සඳහා තෝරා ගත් දිස්ත්‍රික්ක කීපයක පූර්ව පරීක්ෂාවක් සිදු කිරීම
IV. ප්‍රශ්නාවලි වල යෝග්‍යතාවය හඳුනා ගැනීම සඳහා සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ අදහස් හා යෝජනා ලබා ගැනීමට නියමු සමීක්ෂණයක් සිදු කිරීම
V. ආර්ථික ඒකක වලින් විස්තරාත්මක දත්ත රැස් කිරීම සඳහා වූ නියැදිය තේරීම
VI. ප්‍රශ්නාවලි සහ උපදෙස් පොත් සකස් කිරීම සහ අවශ්‍ය ප්‍රමාණය මුද්‍රණය කිරීම
VII. ප්‍රසම්පාදන කටයුතු සහ ප්‍රචාරක කටයුතු
VIII. පුහුණු පංති පවත්වා දත්ත රැස්කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීම

යන කාර්යයන් නිමකොට ඇති අතර මේ වන විට දිවයින පුරා තොරතුරු රැස් කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

### 2.1.3 ගැටුම් හේතුවෙන් මියගිය/තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය - 2013

රට තුළ සන්හින්දියාව ඇතිවන හා සාමය ගොඩනැගෙන යුගයක් පිළිබඳ ඉදිරි දැක්මක් නිර්මාණය කිරීමේ අරමුණින් පිහිටුවන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ අනුව ශ්‍රී ලංකාව තුළ පැවති අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් සිදුව ඇති හානි පිළිබඳව සංගණනයක් පවත්වා තොරතුරු රැස් කළ යුතු යැයි නිර්දේශ වී ඇති බැවින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව උක්ත සංගණනය පවත්වන ලදී. මෙම සංගණනයේ සියළුම තාක්ෂණික කටයුතු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවන ලදී. මෙම සියළු කාර්යයන් ජනාධිපති ලේකම් කාර්යාලය අනුබද්ධව පිහිටුවා ඇති ඒකකයක් මගින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.

මෙම සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු (දත්ත එක් රැස් කිරීම) 2013 වර්ෂයේ සිදු කරනු ලැබූ අතර සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු අවසන් වූ පසු තොරතුරු රැස් කරන ලද උපලේඛන සහ සාරාංශ වාර්තා ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීම 2014 ජනවාරි මුල් සති දෙක තුළදී සිදු කරන ලදී. සංගණන දත්ත සැකසුම් කටයුතු අදියර තුනකින් සිදු කිරීමට සැලසුම් කරන ලදී. ක්ෂේත්‍රයේදී සම්පූර්ණ කරන ලද සියළුම ආකෘති පත්‍ර ප්‍රධාන කාර්යාලයට ලැබී තිබේද යන්න තහවුරු කර ගැනීම පළමු අදියර යටතේ සිදු කරන ලද අතර එය 2014 ජනවාරි මාසය තුළ දී නිම කරන ලදී. සාරාංශ වාර්තා සංස්කරණය කිරීම සහ සාරාංශ වාර්තා වල අඩංගු දත්ත අනුසාරයෙන් මූලික වාර්තාව සකස් කිරීම දෙවන අදියර යටතේ සිදු කරන ලද අතර එය 2014 දෙවන කාර්තුව තුල අවසන් කරන ලදී. සංගණන අවසන් වාර්තාව සඳහා දත්ත සකස් කිරීම තුන්වන අදියර යටතේ සිදු කිරීමට සැලසුම් කරන ලදී. මේ යටතේ සංගණන දත්ත රැස්කල උපලේඛන සංස්කරණය හා කේත කිරීම, දත්ත පරිගනක ගත කිරීම, දත්ත සංස්කරණය හා වගු ගත කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ අවසන් වාර්තාව සකස් කිරීම යන කාර්යයන් සිදු කල යුතුව තිබුනි. උපලේඛන සංස්කරණ කිරීම සහ පරිගණක ගත කිරීම/ පරිලෝකනය කිරීම මෙම වසරේදී නිම කරන ලදී.

### 2.1.4 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සංගණනය

රාජ්‍ය අංශයේ ආයතන 8 ක නියැදියක් තෝරා ගනිමින් ඉහත සංගණනයට අදාල නියමු අධ්‍යයනයක් සිදු කල අතර එම නියමු අධ්‍යයනයේ තොරතුරු රැස් කිරීම සඳහා උපදෙස් හා ප්‍රශ්නාවලිය සම්බන්ධ මෘදුකාංග අදාල නියැදියට ඇතුලත් ආයතන වෙත ලබාදීම මඟින් තොරතුරු රැස් කෙරුණි.

### 2.1.5 ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය - 2014/15

මෙම සමීක්ෂණයට අදාල දත්ත භාවිතා කරන ආයතන සමඟ සම්බන්ධිකරණයෙන් පැවැත්වූ රැස්වීම් වල තීරණ අනුව මූලික ප්‍රශ්නාවලිය සකස්කොට අවසන් වී ඇති අතර ඊට අදාල පුහුණු පංති පැවැත්වීමට හා එම ප්‍රශ්නාවලියේ පූර්ව පරීක්ෂා කටයුතු සිදු කිරීමට සැලසුම් සකස් වෙමින් පවතී.

මෙම සමීක්ෂණය සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත. මෙම සමීක්ෂණ කටයුතු සඳහා Computer Assisted Personal Interviewing (CAPI) තාක්ෂණය යොදා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව ඒ සඳහා වූ තාක්ෂණික උපදෙස් අදාල ආයතන වලින් ලබා ගැනීමේ කටයුතු සැලසුම් කරමින් පවතී.

### 2.1.6 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13

ජාතික ගෘහ ඒකක සමීක්ෂණ වැඩසටහන යටතේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය මෙම දෙපාර්තමේන්තුව මඟින් වසර 3 කට වරක් පවත්වනු ලබයි. මෙම සමීක්ෂණ මාලාවේ 8 වන සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2012 ජුලි මාසයේ ආරම්භ වූ අතර 2013 ජුනි මාසයේ අවසන් විය.

එය මුළු දිවයිනම ආවරණය වන පරිදි මාසික වට 12 කින් පැවැත්විණි. තොරතුරු ලබා ගන්නා උපලේඛනය කාණ්ඩ 9 කින් සමන්විත වන අතර ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, පාසල් අධ්‍යාපනය, සෞඛ්‍යය, ගෘහ ඒකක ආදායම් හා වියදම්, ගෘහ ඒකකය සතුව ඇති කල් පවතින භාණ්ඩ, මූලික පහසුකම් ලබා ගැනීම, ගෘහ ඒකකයේ ණය ගැති භාවය, නිවාස හා සනීපාරක්ෂාව, ස්වාභාවික විපත්, ඉඩම් අයිතිය, සත්ව පාලනය යන ක්ෂේත්‍ර වලට අදාලව තොරතුරු රැස් කරන ලදී. මෙවර සමීක්ෂණයේ ලබා ගත් දත්ත අතර සමාජ ආරක්ෂණ දර්ශකය ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්තද ඇතුලත් කොට ඇත.

මෙම සමීක්ෂණයට අදාල මාස 12 ම ඇතුලත් සාරාංශ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

**වගුව 1 : ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13 - ජාතික මට්ටමේ දර්ශක**

| දර්ශකය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| මාසික ගෘහ ඒකක මධ්‍යනය ආදායම | රු. | 45,878 |
| මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ ආදායම | රු. | 30,814 |
| මාසික ගෘහ ඒකක මධ්‍යනය ඒක පුද්ගල ආදායම | රු. | 11,819 |
| ආදායම් උපයන්නන්ගේ මාසික ගෘහ ඒකක මධ්‍යනය ආදායම | රු. | 25,963 |
| ගෘහ ඒකක ආදායම සඳහා ගිනි සංගුණකය | - | 0.48 |
| මාසික ගෘහ ඒකක මධ්‍යනය වියදම | රු. | 41,444 |
| ආහාර සංගුණකය | %. | 37.8 |
| දරිද්‍රතා දර්ශකය | % | 6.7 |

### 2.1.7 ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය, රැකියා නියුක්ති සහ රැකියා වියුක්ති මට්ටම් සහ ඒවායේ උපනති පිළිබඳ මැන බැලීම සඳහා ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය සැලසුම් කර ඇති අතර 1990 වර්ෂයේ පලමු කාර්තුවේ සිට

නොකඩවා කාර්තු මට්ටමෙන් මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි. මෙහිදී කාර්තුමය ඇස්තමේන්තු ජාතික මට්ටමෙන්ද, වාර්ෂික ඇස්තමේන්තු දිස්ත්‍රික් මට්ටමෙන්ද ඉදිරිපත් කරනු ලබයි.

2014 පලමු හා දෙවන කාර්තු වල අදාල සමීක්ෂණ වාර්තා සකස් කර අවසන් වී ඇති අතර 2014 පලමු කාර්තුවට අදාල වාර්තාව වෙබ් අඩවියේ පලකොට ඇත.

ඊට අමතරව ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය - 2015 සඳහා උපලේඛන මුද්‍රණය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රයට අදාල කටයුතු නියමිත පරිදි ආරම්භ කොට ඇත.

**වගුව 2 : ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය 2013 - සාරාංශ දර්ශක**

| දර්ශකය | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| ශ්‍රම බලකාය (වයස අවු :15 හා ඊට වැඩි ) ('000) | 16,360 | 7,577 | 8,782 |
| ශ්‍රම බල සහභාගීත්වතා අනුපාතිකය (%) | 53.8 | 74.9 | 35.6 |
| රැකියා නියුක්ත ජනගහනය ('000) | 8,418 | 5,499 | 2,919 |
| රැකියා නියුක්ත අනුපාතිකය (%) | 95.6 | 96.8 | 93.4 |
| රැකියා විරහිත ජනගහනය ('000) | 384 | 179 | 205 |
| විරැකියා අනුපාතිකය (%) | 4.4 | 3.2 | 6.6 |

## 2.1.8 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණ කටයුතු වසරකට දෙවරක් සිදු කරන අතර 2013/14 මහ කන්නය හා 2014 යල කන්නය මෙම වර්ෂයට අයත් වේ. 2013/14 මහ කන්නය හා 2014 යල කන්නය සඳහා එක් එක් දිස්ත්‍රික්ක වල වී වගා කෙරෙන ප්‍රභේද නියෝජනය වන ආකාරයට අක්කරයකට/හෙක්ටයාරයට වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා මෙම සමීක්ෂණය පවත්වන ලදී.

ඉහත සමීක්ෂණයට සමගාමීව වී වගාව පිළිබඳ උපාශ්‍රිත තොරතුරු වන එක් එක් වී වර්ග අනුව වගා කොට ඇති බිම් ප්‍රමානයන්, බිම සකස් කරන ආකාරය, පොහොර භාවිතය වැනි විචල්‍යයන් පිළිබඳ දත්තයන්ද එක් රැස් කරන ලදී.

## 2.1.9 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය

2012/13 වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් යන ප්‍රධාන භෝගයන්ගේ නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී. තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ගණනය කිරීමට අදාල විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ කොමසාරිස් අංශයේ සහාය ඇතිව එම කාර්යාලයේ ලියා පදිංචි තේ කම්හල් වලින් එක් රැස් කරන ලදී. රබර් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පවත්වනු ලබන සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය. මෙම සමීක්ෂණ මඟින් ලබා ගන්නා දත්ත මඟින් 2013/14 වගා වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් වල නිෂ්පාදන වියදම් ගණනය කරන ලදී.

## 2.1.10 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛයිමාසික සමීක්ෂණය - 2014

කාර්මික නිෂ්පාදන ආයතන වල නිෂ්පාදන මට්ටම, අමුද්‍රව්‍ය පරිභෝජනය, යෙදවුම්, ඉපයීම් හා සේවා නියුක්තිය පිළිබඳ කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා මෙම සමීක්ෂණය සැලසුම් කර ඇත.

2014 වර්ෂයේ මුල් කාර්තු තුනම සඳහා ක්ෂේත්‍ර කටයුතු සිදු කර වර්ධන අනුපාතික ගණනය කොට එහි ප්‍රතිඵල අවශ්‍ය කටයුතු සඳහා ජාතික ගිණුම් අංශයට යොමු කර ඇත.

ඊට අමතරව 2013 වර්ෂයට අදාල උක්ත සමීක්ෂණයේ හතරවන කාර්තුවේ ක්ෂේත්‍ර කටයුතු සිදුකර ලබාගත් දත්ත ආශ්‍රයෙන් වර්ධන අනුපාතිකය හා 2013 මුළු වර්ෂයම සඳහා වර්ධන අනුපාතික ගණනය කොට අදාල දත්ත ජාතික ගිණුම් අංශයට ලබා දෙන ලදී.

### 2.1.11 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2014

ආර්ථික සංගණනය - 2013/14 යටතේ කර්මාන්ත අංශය සඳහා දත්ත රැස් කිරීම සිදුවූ බැවින් උක්ත සමීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍යතාවයක් නොවූ අතර 2013 වර්ෂයට අදාල උක්ත සමීක්ෂණයේ දත්ත සංස්කරණය හා කේත කිරීම් කටයුතු සිදු කරන ලදී.

### 2.1.12 පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය

සෑම මසකම කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කර ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය මිල තොරතුරු ලබා ගැනීමට මිල හා වේතන අංශයේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය සිදු කරනු ලැබේ.

මෙහිදී තෝරාගත් භාණ්ඩ හා සේවාවන් හි මිල තොරතුරු අඛණ්ඩව තෝරා ගත් වෙළඳ සැල් වලින් එක් එක් භාණ්ඩය සඳහා සකසා ඇති පිරිවිතර තත්වයන්ට අනුකූලව එක් රැස් කරනු ලැබේ. ගෘහ ඒකකයන්ගේ නවතම වියදම් රටාව විදහා දැක්වීමට මෙම තොරතුරු භාවිතා කරනු ලබන අතර මෙම පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණයේ තොරතුරු මගින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය(CCPI) ගණනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබේ.

## 2.2 මෙරට සමාජ ආර්ථික තත්වයන් පිළිබඳ දත්ත එක්රැස්කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් කෙරුණ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

### 2.2.1 වී පිළිබඳ සංඛ්‍යාලේඛන

දිවයින තුල පිහිටි මුළු කුඹුරුබිම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා වාරිමාර්ග ක්‍රම අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් කුඹුරු බිම් ප්‍රමාණය පිලියෙල කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව 2013/14 මහ කන්නය හා 2014 යල කන්නය තුල අස්වද්දන ලද වපුරන ලද හා අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය පිලියෙල කරන ලදී.මේ වන විට අදාල කන්න දෙක සඳහා දත්ත විග්‍රහ කොට දිස්ත්‍රික්ක මට්ටමින් තොරතුරු ප්‍රකාශයට පත්කොට ඇත. එමෙන්ම මහවැලි බල ප්‍රදේශවල කුඩා කළමණාකරණ කොට්ඨාශ මට්ටමෙන්ද සංඛ්‍යාති පිලියෙල කොට ප්‍රකාශයට පත් කර ඇත.

### 2.2.2 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන හා සත්ව සංඛ්‍යාති

කන්න මට්ටමින් වාර්තාකරුවන්ගේ සහාය ඇතිව එක් රැස් කරනු ලබන උස්බිම් වල වගා කරනු ලබන භෝග වල බිම් ප්‍රමානය හා නිෂ්පාදනයට අදාල සංඛ්‍යාතීන් හා වාර්ෂිකව රැස් කරනු ලබන සත්ව පාලනයට අදාල සංඛ්‍යාතීන් සාරාංශ ගත කර රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින් හා අනෙකුත් ආයතන වලට දත්ත ලබා දීමට කටයුතු කරනු ලැබීය.

මෙහිදී, ස්ථිර භෝග සහ කාලීන භෝග යටතේ සුළු අපනයන භෝග, පළතුරු, එළවළු, ධාන්‍ය වර්ග හා රනිල භෝග ඇතුළුව භෝග වර්ග 60 ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ලද බිම් ප්‍රමාණය සහ අස්වැන්න මහ සහ යල කන්න සඳහා ඇස්තමේන්තු කර ප්‍රකාශයට පත් කරනු ලැබීය.

### 2.2.3 කෘෂිකර්ම නිෂ්පාදන පරිමා දර්ශකය

කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි ඇතිවී තිබෙන ප්‍රමාණාත්මක වෙනස්කම් පසුගිය වර්ෂ වලට සාපේක්ෂව විශ්ලේෂණය කිරීමේ අරමුණෙන් කෘෂිකාර්මික නිෂ්පාදන පිළිබඳ වාර්ෂික පරිමා දර්ශකය පිළියෙල කරන අතර වී, ප්‍රධාන අපනයන භෝග, රළු ධාන්‍ය, අනෙකුත් කාලීන භෝග, එළවළු, පලතුරු, සුළු අපනයන භෝග හා පශු ධන නිෂ්පාදන යන අංශ සඳහා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලබයි. මේ සඳහා දැනට පාදක වර්ෂය ලෙස 2002 වර්ෂය සලකනු ලැබේ. 2013 වර්ෂයේ කෘෂිකාර්මික නිෂ්පාදන සැලකිල්ලට ගනිමින් එම වර්ෂය සඳහා පරිමා දර්ශකය පිළියෙල කර ඇත.

### 2.2.4 ජාතික ගිණුම්

ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරීමේ නිල වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව නිෂ්පාදන, ආදායම් හා වියදම් ක්‍රම යටතේ වාර්ෂිකවද නිෂ්පාදන ක්‍රමය යටතේ කාර්තුගතවද ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කෙරේ.

වර්ෂයක් හෝ කාර්තුවක් අවසන් වූ විගස එම කාලයට අදාළ ජාතික ගිණුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත රැස් කිරීම ආරම්භ කෙරේ. දෙපාර්තමේන්තුවේ සංගණන හා සමීක්ෂණවල දත්ත ද වෙනත් සකස් කරන දත්ත හා දර්ශකද ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, මහා භාණ්ඩාගාරය, ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක දත්ත ද මේ යටතේ රැස් කෙරේ.

වර්ෂයකට අදාළ ජාතික ගිණුම් කඩිනම් ඇස්තමේන්තු හා කාර්තුගත ජාතික ගිණුම් ඇස්තමේන්තු අදාළ වර්ෂය අවසන් වී දින 75 කදී ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව, 2013 වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තු සහ 2013 සිව්වැනි කාර්තුවේ ඇස්තමේන්තු ද 2014 වර්ෂයේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි කාර්තු වල ඇස්තමේන්තු ද සකස් කරන ලදී. එසේ සකස් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු සංඛ්‍යා වගු සහ අදාළ කෙටි විශ්ලේෂණයන් සහිත මාධ්‍ය සටහන් ද නියමිත පරිදි දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියට ඇතළත් කිරීමෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

2014 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව හා වෙනත් දේශීය හා විදේශීය ආයතන හා පුද්ගලයන්ට වර්ෂය පුරා සපයන ලදී.

ජාතික ගිණුම් වාර්ෂික ප්‍රකාශනයෙහි 40 වැනි නිකුතුව ලෙස " NATIONAL ACCOUNTS OF SRI LANKA 2013", 2014 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

**වගුව 3 : වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ප්‍රධාන දර්ශක**

| දර්ශකය | 2012 | 2013 |
|---|---:|---:|
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය(%) | 6.3 | 7.2 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (රුපියල්) | 372,814 | 423,484 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) | 2,922 | 3,280 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (රුපියල්) | 365,194 | 412,447 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) | 2,862 | 3,195 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | 3.0 | 12.3 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | 2.0 | 11.6 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100) | 248.9 | 265.6 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය අනුව උද්ධමනය (%) | 8.9 | 6.7 |


## 2.2.5 කොළඹ පාරිභෝගික මිල දර්ශකය(CCPI) - (පදනම 2006/07 = 100)

ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමේ නිල මිනුම ලෙස 2011 ජූනි මාසයේ සිට මෙම දර්ශකය (පදනම 2006/07 = 100) භාවිතා කරන ලදී. ඒ අනුව 2013 සහ 2014 වසර වල කොළඹ පාරිභෝගික මිල දරර්ශකයේ විචලනය පහත වගු මගින් දැක්වේ.

**වගුව 4 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විචලනය, 2013/14**

| වර්ෂය | මාසය | දර්ශක අංකය | උද්ධමන අනුපාතිකය (ලක්ෂමය උද්ධමනය) |
|---|---|---|---|
| **2013** | ජනවාරි | 170.0 | 9.8 |
| | පෙබරවාරි | 170.7 | 9.8 |
| | මාර්තු | 170.8 | 7.5 |
| | අප්‍රියෙල් | 170.0 | 6.4 |
| | මැයි | 173.9 | 7.3 |
| | ජුනි | 176.5 | 6.8 |
| | ජූලි | 176.8 | 6.1 |
| | අගෝස්තු | 176.2 | 6.3 |
| | සැප්තැම්බර් | 175.8 | 6.2 |
| | ඔක්තෝම්බර් | 176.1 | 6.7 |
| | නොවැම්බර් | 176.5 | 5.6 |
| | දෙසැම්බර් | 176.5 | 4.7 |
| **2014** | ජනවාරි | 177.5 | 4.4 |
| | පෙබරවාරි | 177.8 | 4.2 |
| | මාර්තු | 177.9 | 4.2 |
| | අප්‍රියෙල් | 178.4 | 4.9 |
| | මැයි | 179.5 | 3.2 |
| | ජුනි | 181.4 | 2.8 |
| | ජූලි | 183.2 | 3.6 |
| | අගෝස්තු | 182.3 | 3.5 |
| | සැප්තැම්බර් | 181.9 | 3.5 |
| | ඔක්තෝම්බර් | 179.0 | 1.6 |
| | නොවැම්බර් | 179.2 | 1.5 |
| | දෙසැම්බර් | 180.2 | 2.1 |

**සටහන 1 : කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම (2006/07=100)**



## 2.2.6 නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI)

රටක ජාතික සංඛ්‍යාලේඛන වැඩසටහනට ඇතුලත් වන මූලික විෂයයක් ලෙස නිෂ්පාදකයාගේ මිල දර්ශකය හැඳින්විය හැකි අතර දේශීය නිෂ්පාදකයා තම නිපැයුම් වලට ලබා ගන්නා මිලේ සිදුවන වෙනස් වීම මෙමගින් මනිනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා මෙන්ම එහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ද මෙම මිල දර්ශකය ඉතා අවශ්‍ය මෙවලමකි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතන හා රටේ නීති සම්පාදකයින් මෙන්ම ප්‍රතිපත්ති සැලසුම් කරන්නන්ටද මෙම දර්ශකාංකය භාවිතා කිරීමට උනන්දු වෙති. ආරම්භයේදී කෘෂිකර්මාන්ත, නිෂ්පාදන කර්මාන්ත හා උපයෝගීතා කර්මාන්ත (විදුලිය හා ජලය සැපයීම) යන අංශ ආවරණය වන පරිදි මෙම තොරතුරු රැස් කරන අතර, භූගෝලීය වශයෙන් සලකන කල බස්නාහිර, මධ්‍යම හා දකුණු යන පළාත් පමණක් මේ දක්වා ආවරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ මිල සංඛ්‍යාති වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදේශකවරයා පසුගියදා මිල අංශයට පැමිණි අවස්ථාවේ මීට අදාල මූලික තොරතුරු රැස් කිරීමේ පත්‍රිකාව හා මිල රැස් කිරීමේ පත්‍රිකාව වැඩි දියුණු කල අතර ඊට අදාලව ප්‍රතිචාරකයන් දැනුවත් කිරීම සහ නිෂ්පාදකයාගේ මිල දර්ශකය පිළිබඳ හැඳින්වීමක් සහිත කෙටි සටහනක් පිළියෙල කිරීමට ද කටයුතු කරන ලදී. මෙම තොරතුරු රැස් කිරීම සහ තෝරා ගන්නා ලද නියැදියට අදාල ආයතන 378 ක්ම ආවරණය වන පරිදි ක්ෂේත්‍ර වැඩසටහනක් දියත් කළ අතර එහිදී බර තැබීම් සිදු කිරීමට අවශ්‍ය නිමැවුම්, ගනුදෙනු සිදුවන ආකාරය පිළිබඳව මූලික තොරතුරු රැස් කරන ලදී. ඒ සමගම තෝරා ගත් නිෂ්පාදන වල මිල ගණන් 2013 වර්ෂයේ 4 වන කාර්තුව හා 2014 වර්ෂයේ පලමු කාර්තුවට අදාලව රැස් කරන ලදී. ක්ෂේත්‍රයට යන අවස්ථාවේදී වසා තිබුණු ආයතන, ආවරණ පථයෙන් පිටත පිහිටි ආයතන හා තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ ආයතන සඳහා නැවත ආයතන තෝරා තොරතුරු රැස් කිරීම ද මේ වන විට සිදු කෙරෙමින් පවතී.

## 2.2.7 සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල ගණන්

මෙම අංශය මගින් ඉටු කරනු ලබන තවත් කාර්යයක් වන නාගරික සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීමේදී එම ක්‍රියා පිළිවෙල වැඩි දියුණු කිරීම සඳහා, 2014 වර්ෂයේ 2 වන කාර්තුවේ සිට නාගරික සිල්ලර මිල ගණන් රැස් කිරීමේ ආකෘති සංශෝධනය කරන ලදී. සියළුම දිස්ත්‍රික්ක වල ප්‍රධාන නගරයන්හි ආහාර හා විවිධ පාරිභෝගික භාණ්ඩ පිළිබඳ සිල්ලර මිල ගණන් සතිපතා, මාසිකව හා කාර්තුමය පදනමක් මත එක් රැස් කරනු ලබන අතර මෙරට ආහාර බෝග වගා කරන්නන්ගේ මිල ගණන් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රමවත්ව, මාසිකව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගැනීමෙන් එක් රැස් කරවා මිල හා වේතන අංශය වෙත ගෙන්වා ගනු ලැබේ. මෙම තොරතුරු ඇතුලත් කර 2013 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා සති පතා සිල්ලර මිල ගණන් (කොළඹ දිස්ත්‍රික්කය) හි මිල විවරණිකාවේ 22 නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී. 2010 – 2013 දක්වා විස්තර ඇතුලත් සිල්ලර හා නිෂ්පාදකයාගේ මිල ගණන් පිළිබඳ විවරණිකාවේ 31 වැනි නිකුතුව මුද්‍රණය කිරීමේ කටයුතු මේ වන විට අවසාන අවස්ථාවේ පවතී

තවද, මෙම සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයට කාර්තුමය වශයෙන් ලබා දෙනු ලැබේ. මෙයට අමතරව දත්ත භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන් සඳහා ද මෙම තොරතුරු ලබා දීමට කටයුතු සලසා ඇත. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, විවෘත වෙළඳපළ සිල්ලර මිල ගණන් විවරණිකාව ජනාධිපති ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිලධාරීන් වෙත සතිපතා ඉදිරිපත් කරනු ලැබේ. මෙම මිල ගණන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ද ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2014 වර්ෂය සඳහා යුධ හමුදා නිලධාරීන්ගේ සහ අනෙකුත් තරාතිරම් වල පුද්ගලයින්ගේ සලාක වටිනාකම ගණනය කර යුධ හමුදාපති වෙත ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලැබේ.

## 2.2.8 ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI)

දැනට ගණනය කරනු ලබන පාරිභෝගික මිල දර්ශකය නාගරික අංශයට පමණක් සීමාවන අතර එය කොළඹ දිස්ත්‍රික්කයෙන් එකතු කරනු ලබන මිල තොරතුරු මත රඳා පවතී. කොළඹ පාරිභෝගික මිල දර්ශකය හැර ජාතික මට්ටමින්, පළාත් මට්ටමින් හෝ වෙනත් ප්‍රදේශයන් ආවරණය වන පරිදි මේ දක්වා පාරිභෝගික මිල දර්ශකයක් ප්‍රකාශයට පත් කර නොමැත. වර්තමාන පාරිභෝගික මිල දර්ශකයේ බර තැබීම් ව්‍යුහය2006/07 වසරේදී සිදු කරන ලද ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය මගින් ලද ගෘහ ඒකක වියදම් තොරතුරු මත රඳා පවතී. මෙම බර තැබීම් ව්‍යුහය මගින් විදහා දැක්වෙනුයේ කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ගෘහ ඒකකයන්ට අදාල වියදම් රටාව පමණක් වන බැවින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග පැවති සාකච්ඡාවේදී පාරිභෝගික මිල දර්ශකයේ ආවරණ පථය කොළඹ දිස්ත්‍රික්කයෙන් ඔබ්බට ගෙන යායුතු බවත්, ජාතික මට්ටමින් සහ පළාත් මට්ටමින් දර්ශකයන් ප්‍රකාශයට පත්කිරීමේ වැදගත්කමත් පෙන්වා දෙන ලදී. එමෙන්ම දත්ත භාවිතා කරන්නන්හට පළාත් 9 සඳහා වෙන වෙනම දර්ශාකංක භාවිතා කළ හැකි වීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම නව දර්ශකයන් ගණනය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (IMF) සහය ලැබී ඇති අතර ඒ අනුව මෙම අංශයේ නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව වරින් වර ලබා දී ඇත. ඊට අමතරව එම අරමුදලේ උපදේශකයකු වරින් වර ලංකාවට පැමිණ අදාල කටයුතු වල ප්‍රගතිය පිළිබඳ සොයා බලනු ලැබේ. ඒ අනුව 2013 වර්ෂයේ සිට මේ දක්වා දෙවරක් මෙම උපදේශකවරයා ලංකාවට පැමිණ ලබා දෙන ලද උපදෙස් අනුව 2009/10 වර්ෂයන්හිදී සහ 2012/13 වර්ෂයන්හිදී සිදු කරන ලද ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණ වලින් ලබා ගන්නා ලද දත්ත පාදක කරගෙන ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය ගෘහ ඒකකයන්හී පරිභෝජන රටාවන් සියල්ලම ආවරණය වන පරිදි අදාල දර්ශකයන් ගණනය කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාව සඳහා වන නව ජාතික පාරිභෝගික මිල දර්ශකය පළාත් 9 හිම බර තැබීම් ව්‍යුහයන් මත රඳා පවතින අතර ඉතා ඉක්මනින් මෙය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 2.2.9 පළාත් පාලන සංඛ්‍යාති

දෙපාර්තමේන්තුව මගින් සෑම වර්ෂයකම පලාත් පාලන සංඛ්‍යාති සැකසීම සිදු කරනු ලබයි. මේ සඳහා සියළුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා ඇතුලත් පලාත් පාලන ආයතනයන්හි ආදායම්, වියදම් දත්ත හා එමගින් සපයන සේවාවන්, යටිතල පහසුකම් ඇතුළු පොදු තොරතුරු රැස් කරනු ලැබේ. මෙම සියළුම තොරතුරු දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හරහා පලාත් පාලන ආයතන මඟින් ලබා ගනු ලැබේ. මෙම ලබාගන්නා තොරතුරු විශ්ලේෂණය කොට ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තු ජාතික ගිණුම් අංශයට ලබාදෙන අතරම වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධනය හා සංඛ්‍යාන අත්පොතෙහි එම තොරතුරු ඇතුලත් කරනු ලැබේ.

2013 වර්ෂයට අදාල පලාත් පාලන සංඛ්‍යාති 2014 වර්ෂයේ ප්‍රකාශයට පත්කල සංඛ්‍යාන නිබන්ධනයේ හා සංඛ්‍යාන අත්පොතෙහි ඇතුලත් කල අතර 2014 වර්ෂයට අදාල පලාත් පාලන සංඛ්‍යාති 2015 වර්ෂයේ ප්‍රකාශයට පත් කරනු ලබන උක්ත ප්‍රකාශන වල ඇතුලත් කරනු ලැබේ.

## 2.2.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා වූ සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ දත්ත රැස් කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සංගණන හා සමීක්ෂණ මගින් ලබාගෙන මේ වන විට අදාල යාවත්කාලීන කිරීම් සිදු කර ඇත.

**ජාතික දත්ත කමිටුව (NDC)**

මෙම කමිටුවට අදාල අනු කමිටු 22 ක සම්බන්ධීකරණ කටයුතු පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය මඟින් සිදු කරනු ලැබේ. මේ වන විට ඉන් අනු කමිටු 2 ක නිල සංඛ්‍යාති සකස් කර ඇති අතර ඉතිරි අනු කමිටු මඟින් අදාල සංඛ්‍යාති සකස් කරමින් පවතී.

**ස්ත්‍රී/පුරුෂ භාවය පිළිබඳ සංඛ්‍යාති (Gender Statistics)**

දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සංගණන හා සමීක්ෂණ තොරතුරු භාවිතා කරමින් ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රකාශනයක් **Gender Statistics** නිකුත් කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර මේ වන විට එම ප්‍රකාශනයේ දළ පිටපත සකස් කර අදාල අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.

## 2.2.11 පුහුණු කටයුතු

සංඛ්‍යාන පුහුණු අංශය මඟින් 2014 වර්ෂය සඳහා පුහුණු පාඨමාලා 16 ක් පවත්වා ඇත.

I. දෙමළ භාෂා පුහුණුව (III මට්ටමේ සිට I මට්ටම දක්වා)
II. දෙමළ භාෂා පුහුණුව (III මට්ටම)
III. දෙමළ භාෂා පුහුණුව (II මට්ටම)
IV. සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව
V. "Sampling Method" පුහුණු පාඨමාලාව
VI. "Analyzing Survey Data using Categorical Data Analysis and Report Writing" පුහුණු පාඨමාලාව
VII. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධ පුහුණුව
VIII. විදේශීය පුහුණු පාඨමාලාවකට සහභාගිවීමෙන් පසුව දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු සැසිය
IX. මූලික සංඛ්‍යානය හා SPSS භාවිතය පිළිබඳ පුහුණුව
X. "In Design" පුහුණු පාඨමාලාව
XI. "Project Management" පුහුණු පාඨමාලාව
XII. "Arc GIS" පුහුණු පාඨමාලාව
XIII. "In Design" පුහුණු පාඨමාලාව
XIV. සංඛ්‍යාන පුහුණු වැඩමුළුව
XV. "Dev Info" පුහුණු පාඨමාලාව
XVI. දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබන සංගණන හා සමීක්ෂණ පිළිබඳව යාපනය විශ්ව විද්‍යාලයීය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

මීට අමතරව සංඛ්‍යාලේඛන සහකාරවරුන්,දත්ත සටහන් ක්‍රියාකරු හා ක්ෂේත්‍ර ලිපිකරු නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් පැවැත්වීමටද හැකිවිය.

## 2.2.12 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබූ සංගණන හා සමීක්ෂණ වල දත්ත සැකසුම් කටයුතු ද ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ වලට අයත් දත්ත සැකසුම් කටයුතු ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් සිදු කරන ලදී.

I. **ජන හා නිවාස සංගණනය - 2012 ( 5% නියැදිය)**

නිවාස, රැකියා හා කර්මාන්ත සම්බන්ධ සියළුම දිස්ත්‍රික්ක වලට අදාල වගු ලබාදී අවසන් වී ඇති අතර කේතයන් යෙදීමට ඇති ස්ථාන වලට අදාල කේත සටහන් කිරීම ද සිදුකර ඇත.

II. **ජන හා නිවාස සංගණනය - 2012 (100%)**

සියළුම දිස්ත්‍රික්ක හා ශ්‍රී ලංකාව සඳහාම Excel ආකෘතියට අනුව සකස් කල වගු සියල්ලම ලබාගෙන අදාල අංශයට භාර දී ඇත.

III. **ශ්‍රම බල සමීක්ෂණය - 2013**

උක්ත සමීක්ෂණය මොණරාගල හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලට අයත් දත්ත සටහන් කිරීම හා දත්ත සැසඳීමේ කටයුතු සිදුකිරීම අවසන් කොට දත්ත ගොනු අදාල අංශයට ලබා දී ඇත.

IV. **ආර්ථික සංගණනය - 2013/14**

දිස්ත්‍රික්ක 20 ක F1 ආකෘතීන් සඳහා උක්ත දත්ත සටහන් කිරීම හා සැසැඳීම නිමකර ඇත.

V. **ගැටුම් හේතුවෙන් මිය ගිය/ තුවාල ලැබූ පුද්ගලයින් හා දේපල හානි පිළිබඳ සංගණනය - 2013 (LLRC)**

දිස්ත්‍රික්ක 6 ක ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමෙන් L2 ආකෘතියේ සඳහන් දත්ත, දත්ත සටහන් කිරීම හා සැසැඳීමේ කටයුතු නිම කර ඇත.

VI. **ශ්‍රී ලංකා රේගු දත්ත - 2014**

2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මාස වල දත්ත ගොනු සකස් කොට අවසන් කල අතර පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා වගු සියල්ල සකස් කිරීම අවසන් කොට ඇත.

VII. **වෛද්‍ය සංඛ්‍යාලේඛන - 2012**

**Report on Indoor Morbidity and Mortality in Hospitals – (IMMR)**

දිස්ත්‍රික්ක 8 ක දත්තයන්, දත්ත සටහන් කිරීම නිම කර ඇත.

VIII. **කඩිනම් දත්ත වැඩ සටහන (Accelerated Data Programme) ADP**

මෙම වැඩසටහනට අදාල යාවත්කාලීන කිරීම් හා වෙබ් සටහන් යාවත්කාලීන කිරීම් සිදු කරමින් පවතී.

IX. **Lanka SIS**

තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීම හා එමඟින් සංඛ්‍යාන තොරතුරු දත්ත භාවිතා කරන්නන්ට ලබාදීමේ කටයුතු නිමකොට ඇත.

### 2.2.13 ප්‍රකාශන කටයුතු

සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත, දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ දෙපාර්තමේන්තු දින පොත මුද්‍රණය කිරීම සහ දෙපාර්තමේන්තු ප්‍රකාශන බෙදා හැරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යභාරය වේ.

ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක තොරතුරු සැපයීම පෙරදැරි කර ගෙන සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත හා සංඛ්‍යාන දත්ත පත්‍රිකාව වාර්ෂිකව මුද්‍රණය හා වෙබ් අඩවියේ

ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශන අංශයෙන් සිදු කෙරේ. 2013 වර්ෂය සඳහා වූ දත්ත ඇතුලත් මෙම සියළු ප්‍රකාශන මුද්‍රණය කොට බෙදා හරිනු ලැබ ඇත.

දෙපාර්තමේන්තුව සම්බන්ධ ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුත් සිද්ධි ඇතුලත් වාර්තා හා ලිපි එකතුවක් ලෙස සංඛ්‍යාන පුවත් විවරණිකාව ප්‍රකාශයට පත් කරනු ලබන අතර, පසුගිය වර්ෂය සඳහා දෙවරක් නිකුත් කර ඇති මෙම විවරණිකාව වෙබ් අඩවිය හරහා මුදා හැර ඇත.

දෙපාර්මේන්තුවේ මෙහෙවර සාධනය කර ගැනීමෙහිලා දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ විසින් ඉදිරි වර්ෂය තුල ඉටු කිරීමට අපේක්ෂිත වැඩසටහන් ඇතුලත් කර දෙපාර්තමේන්තුවට අනුමත ඇස්තමේන්තු යටතේ නියමිත මුදල් වර්ෂයට අනුකූලව දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම ප්‍රකාශන අංශය විසින් සිදු කරනු ලබයි. 2015 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාශයට පත් කෙරිනි.

දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් හා දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන වල පිහිටි සංඛ්‍යාලේඛන අංශ මගින් ඉටු කරනු ලැබූ කාර්ය භාරය සහ අදාල වර්ෂයේ මූල්‍ය වාර්තාව සම්බන්ධ තොරතුරු ඇතුලත් දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාව වාර්ෂිකව ප්‍රකාශන අංශය මගින් සම්පාදනය කරනු ලබයි. මෙම වාර්තාවෙහි පිටපත් අවශ්‍ය ආයතන වෙත ලබා දෙනු ලබන අතර වාර්තාවේ සංයුක්ත තැටි 350 ක් පාර්ලිමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන සියළුම ප්‍රකාශන හා පත්‍රිකා සඳහා ISBN හා ISSN අංක ලබා දීමත්, එම ප්‍රකාශන වලට මිල නියම කිරීමත් සිදු කරනු ලබන අතර දෙපාර්තමේන්තු මෙහෙවර සාධනය කර ගැනීම සඳහා තොරතුරු බෙදා හැරීම වැදගත් කර්තව්‍යයක් බැවින් දෙපාර්තමේන්තුව මුද්‍රණය කරන වැදගත් ප්‍රකාශන දේශීය මෙන්ම විදේශීය ආයතනයන්ට බෙදා හැරීම සිදු කරනු ඇත.

විවිධ තොරතුරු අන්තර්ගත කරමින් දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර දින පොත 2015 වර්ෂය සඳහා සකස් කර බෙදා හැරීම ප්‍රකාශන අංශය මගින් සිදු කර ඇත.

### 2.2.14 මුද්‍රණ කටයුතු

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ සඳහා උපලේඛන, ප්‍රශ්නාවලි උපදෙස් අත්පොත් මෙන්ම සංගණන හා සමීක්ෂණ වාර්තා ද මුද්‍රණය කිරීම දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අංශයේ වගකීම වේ.

2014 වසර තුලදී පහත සඳහන් ප්‍රකාශන මුද්‍රණය කරන ලදී.

I. සංඛ්‍යාන නිබන්ධනය - 2012
II. සංඛ්‍යාන නිබන්ධනය - 2013
III. News letter – 2014 නිකුතුව I
IV. දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා අවශ්‍යවූ සියළුම මුද්‍රණ කටයුතු
V. ශ්‍රමබල සමීක්ෂණ උපලේඛන
VI. ආර්ථික සංගණනය - 2013/14 කෘෂිකර්ම අංශය සඳහා සියළුම උපලේඛන, උපදෙස් පොත්, කේත ලැයිස්තු මුද්‍රණය
VII. ආර්ථික සංගණනය - 2013/14 කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය උපලේඛන, උපදෙස් පොත්, කේත ලැයිස්තු මුද්‍රණය
VIII. සංඛ්‍යාන අත්පොත - 2013 මුද්‍රණය
IX. වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2013
X. ජාතික ගිණුම් ක්‍රම වේදය
XI. ජාතික ගිණුම් ප්‍රකාශනය - 2012

XII. කර්මාන්ත සමීක්ෂණ වාර්තාව - 2012
XIII. ශ්‍රමබල සමීක්ෂණ - 2012 , 3 වන කාර්තු වාර්තාව
XIV. ශ්‍රමබල සමීක්ෂණ - 2013, වාර්ෂික සංක්ෂිප්ත වාර්තාව
XV. ක්ෂේත්‍ර දින පොත - 2015
XVI. සංඛ්‍යාන අත්පොත - 2014 මුද්‍රණය
XVII. Statistical Pocket Book 2014 මුද්‍රණය
XVIII. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2012/13 (ප්‍රාථමික වාර්තාව)

මුද්‍රණ යන්ත්‍රයක් අළුත් වැඩියා කිරීමට සිදුවීම හේතුවෙන් හා වෙනත් හදිසි කාර්යයන් වෙනුවෙන් කාර්ය බහුල වීම නිසා 2014 වර්ෂයේ මුද්‍රණය කිරීමට නියමිතව තිබූ ප්‍රකාශන 2 ක් 2015 වර්ෂයේ මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

## 2.2.15 සිතියම් විද්‍යා කටයුතු

ජන හා නිවාස සංගණනය - 2012 සඳහා භාවිතා කළ ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් අංකිත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර මේ වන විට ගාල්ල, මාතර යන දිස්ත්‍රික්ක වලට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් ගත කිරීමේ කටයුතු 80% ක් පමණ නිම කොට ඇත. ඊට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් අංකිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

තවද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ සම්බන්ධිත ආයතන වලට සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය සිතියම් සකස් කිරීමේ කටයුතු අදාල ආයතන වලින් කරනු ලබන ඉල්ලීම් අනුව ඉටු කර දී ඇත. MRCB දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු කාලීනව සිදු වන වෙනස්වීම් අනුව අඛණ්ඩව ඉටු කරනු ලබයි.

## 2.2.16 දත්ත නිකුත් කිරීමේ කටයුතු

### I. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම

දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර දත්ත ගොනු නිකුත් කිරීමේ ප්‍රතිපත්තියට (Micro Data Dissemination Policy) අනුකූලව මෙම ඒකකය මඟින් 2014 වර්ෂයේදී 25% දත්ත ගොනු 24ක් නිකුත්කල අතර 100% දත්ත ගොනු 30 ක් නිකුත්කරන ලදි. දත්ත භාවිත කරන්නන් වෙත වඩාත් කාර්යක්ෂම ලෙස දත්ත ගොනු නිකුත් කිරීම සඳහා 2014 වර්ෂය තුල දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය දෙවරක් යාවත්කාලීන කරන ලදී; Version 1.0 – 2014.09.10; Version 1.1 – 2014.10.16. දත්ත ගොනු වල ධාරිතාවය පදනම් කරගෙන මුදල් අය කිරීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීම මඟින් පෞද්ගලිකව පර්යේෂණ කරන්නන්ට හා පර්යේෂණ ආයතන වෙත ක්ෂුද්‍ර දත්ත ගොනු භාවිතා කිරීම සඳහා වඩාත් පුළුල් ප්‍රවේශයක් ලබා දෙන ලදී.2014 වර්ෂය තුල මුදල් අයකිරීම මත දත්ත ගොනු 2 ක් නිකුත් කරනු ලැබීය.

### II. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම

අධ්‍යක්ෂ ජනරාල් වෙත එවනු ලබන ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව තුල ගරු මැති ඇමතිවරුන්ගේ වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය වන දත්ත හා තොරතුරු සැපයීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කරනුලබන්නේ ද දත්ත නිකුත්කිරීමේ ඒකකය මඟිනි. අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නයට අනුව දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සම්බන්ධීකරණය කරගනිමින් අදාල පිළිතුරු ත්‍රෛභාෂිකව සකසා අධ්‍යක්ෂ ජනරාල් මඟින් අදාල ඉල්ලීම් කරන ලද ගරු මැති ඇමැතිතුමන්ලාට හෝ මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත

කඩිනමින් ලබාදීම සිදුකරනු ලැබේ. මෙවැනි ඉල්ලීම් 2014 වර්ෂයේ 07ක් ලැබුණු අතර එම සියල්ලටම පිළිතුරු ලබා දෙන ලදී.

III. **වෙනත් ආයතන වල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම**

අධ්‍යක්ෂ ජනරාල් වෙත එවනු ලබන විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු/ අනෙකුත් ආයතන සහ පුද්ගලයින්ගේ දත්ත ඉල්ලීම් සඳහා අදාල තොරතුරු සැපයීම සිදු කරනු ලබන්නේද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟිනි. පෙර වර්ෂය තුල සාමාන්‍ය තැපෑලෙන් ලබා දුන් තොරතුරු දත්ත ඉල්ලීම් 34 කට අමතරව විද්‍යුත් තැපෑල මඟින් ද දත්ත ඉල්ලීම් 120 කට පමණ තොරතුරු ලබා දී ඇත. මීට අමතරව දත්ත භාවිතාකරන්නන් දුරකතන මඟින් කරනු ලබන දත්ත හා තොරතුරු විමසීම් සඳහා අවශ්‍ය තොරතුරු හා සම්බන්ධීකරණය කිරීම ද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟින් සිදුකරන ලදි.

IV. **දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යාම**

දීපව්‍යාප්ත මට්ටමින් විසිරී සිටින ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යමින් ඉහළ කළමනාකරණයේ අවශ්‍යතාවයන් සඳහා එමගින් තොරතුරු ලබා දීම සිදුකරනු ලබන්නේ ද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟිනි. මෙම දත්ත පද්ධතිය දෙපාර්තමේන්තු පාලන අංශය මඟින් ලබා දෙන තොරතුරු අනුව යාවත්කාලීන කරනු ලබයි.

V. **දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි කවුළුව පවත්වාගෙන යාම**

දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රකාශනයන් අලෙවි කිරීම සඳහා ඇති අලෙවි කවුළුව මෙම ඒකකය තුල ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තු ප්‍රකාශන අංශය මඟින් ලබාදෙන දෙපාර්තමේන්තු ප්‍රකාශනයන් මෙහි අලෙවි කරනු ලැබේ. 2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විවිධ සංඛ්‍යානමය ප්‍රකාශන වල පිටපත් 488 ක් අලෙවි කර ඇත.

## 2.2.17 පුස්තකාල සේවා

දෙපාර්තමේන්තු පුස්තකාලය විමර්ශන අංශය හා බැහැරව දීමේ අංශය වශයෙන් කොටස් 2 කින් සමන්විතය.

දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙන් ම බාහිර පාඨකයන් සඳහා ද විමර්ශන අංශය විවෘතව ඇති අතර දෙපාර්තමේන්තුවට අදාළ පැරණි සහ නව ප්‍රකාශන සහ ශ්‍රී ලංකා ග්‍රන්ථ එකතුව මෙයට අයත් වේ. මෙම ප්‍රකාශන විමර්ශනය සඳහා පමණක් වෙන් කර ඇත. ඊට අමතරව දෙපාර්තමේන්තු පුස්තකාලයේ නොමැති ප්‍රකාශන වෙනත් පුස්තකාලවලින් අන්තර් පුස්තකාල පිරුළු සේවය යටතේ ලබා දීම සේවාවද ක්‍රියාත්මක වේ.

බැහැරදීම් අංශයේ දෙපාර්තමේන්තු ප්‍රකාශනවලට අමතරව විවිධ විෂයයන්ට අදාළ එනම්, සංඛ්‍යානය, සිතියම් විද්‍යාව, ප්‍රජා විද්‍යාව, පරිගණක විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, කළමනාකරණය, ගණිතය, පුස්තකාල විද්‍යාව යනාදී විෂයය ග්‍රන්ථ මෙන්ම සාමාන්‍ය කියවීම් සඳහා උචිත ආගමික හා විවිධ සාහිත්‍ය කෘති (නව කතා, කෙටි කතා, පරිවර්තන) ඇති අතර දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පමණක් බාහිර පරිශීලනයට නිකුත් කරනු ලැබේ.

**පුස්තකාල පොත් සංඛ්‍යාංකකරණය**

අන්තර්ජාලය පදනම් කරගත් පුස්තකාල ස්වයංකරණ සූචිය (Web Based Automated Library Catalogue System) ව්‍යාපෘතිය යටතේ පුස්තකාල පොත් දත්ත පදනමට ඇතුළත් කර ඇත. මේ සඳහා විවෘත මෘදුකාංගයක් වන KOHA භාවිත කරනු ලැබේ.

ජාතික විද්‍යා පදනම් ආයතනය මගින් ක්‍රියාත්මක "ජාතික සංඛ්‍යාකකරණ ව්‍යාපෘතිය" සඳහා දෙපාර්තමේන්තු පුස්තකාලය ද තෝරාගන ඇති අතර එමගින් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත පැරණි සහ දුර්ලභ ප්‍රකාශන (Blue Books) සංඛ්‍යාංකකරණය කර (Digitize) දත්ත පදනමකට ඇතුළත් කරමින් පවතී.

**පුවත්පත් අංශය**

පුස්තකාලයට ලබා ගන්නා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශිත පුවත්පත් දෛනිකව ලබා ගැනීම සහ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත හා දෙපාර්තමේන්තුවට අදාල පුවත් උපුටන අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂ - 02 වන අංශය, අධ්‍යක්ෂ - 04 වන අංශය වෙත ඡායා පිටපත් කර යැවීම ද කරනු ලැබේ.

**ව්‍යාප්ති සේවා**

2014 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ දී දෙපාර්තමේන්තු ප්‍රකාශනවලින් සමන්විත ප්‍රදර්ශන හා අලෙවි කුටියක් පවත්වන ලදී.

## 2.2.18 ක්ෂේත්‍ර කළමණාකරණ කටයුතු

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හා ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මනාව පවත්වා ගෙන යාම සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාල්ඛන අංශ වලට අවශ්‍ය විවිධ ප්‍රතිපාදන, භෞතික පහසුකම් හා විවිධ ආකෘති පත්‍ර ලබා දීමේ කටයුතු සිදු කිරීම ක්ෂේත්‍ර කළමණාකරණ අංශයේ වගකීමයි. එය සපුරාලමින් මෙම වර්ෂයේ කාර්තුමය වශයෙන් ඉන්ධන ප්‍රතිපාදන, රියදුරු බටා හා අතිකාල දීමනා සඳහා ප්‍රතිපාදන ලබා දීමත් සය මාසික වශයෙන් යවනු ලබන දිස්ත්‍රික් ප්‍රධානීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන ලබා දීමත් ප්‍රධාන කොට අනෙකුත් ප්‍රතිපාදන යැවීම් සිදු කරන ඇත.

දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත පිළියෙල කිරීම සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ලිඛිත උපදෙස් ලබාදීමත් ඒ සඳහා වූ පුහුණු වැඩ මුළු පැවැත්වීමත් සිදු කරන ලදී.

වාර්ෂික ප්‍රජා විද්‍යාත්මක, කෘෂිකර්ම හා කර්මාන්ත කමිටු රැස්වීම් වල සම්බන්ධීකරණ කටයුතු ක්ෂේත්‍ර කළමණාකරණ අංශයට පැවරී තිබූ අතර ඉන් ප්‍රජා විද්‍යාත්මක කමිටු රැස්වීම හා කෘෂිකර්ම කමිටු රැස්වීම 2014 වර්ෂයේ මුල් භාගයේ පැවැත්වීමට හැකිවිය. අනෙකුත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ සමඟ ප්‍රධාන කාර්යාලයේ අංශ වැඩ කටයුතු කිරීමේදී ක්ෂේත්‍ර කළමණාකරණ අංශයේ සම්බන්ධීකරණය එම කාර්යයන් නිසි ලෙස කළමණාකරණය කර ගැනීම සඳහා මනා පිටුවහලක් විය.

2014 වර්ෂය තුල ආර්ථික සංගණනයට අදාල කෘෂිකර්ම හා කර්මාන්ත අංශ වල සංගණන කටයුතු සඳහා නිලධාරීන් සියළු දෙනාම නිරත වී සිටි බැවින් හොඳම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය තේරීම, දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ වාර්ෂික වැඩමුළුව පැවැත්වීම හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව හා හැකියාව ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළුව පැවැත්වීමට නොහැකි විය.

## 2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.3.1 වාර්ෂික රැකියා සමීක්ෂණය

කම්කරු දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට ඇති සංඛ්‍යාලේඛන අංශය මගින් දිවයිනේ පිහිටි පුද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහි අර්ථසාධක අරමුදලට දායක වන ව්‍යාපාර හා සේවා ආයතන සම්බන්ධව වසරේ ජූනි මස අවසන් වැඩ කරන දිනය පදනම්ව, ස්ථර අනුව ප්‍රමාණයට සමානුපාතිකව තෝරා ගත් නියැදියන් ඇසුරින් තැපැල් මගින් වාර්ෂිකව තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබේ. දිවයිනෙහි සංවිධානය වූ සේවා නියුක්තිය, කර්මාන්ත හා වෘත්තීය වර්ගීකරණ තොරතුරු ඇතුළුව කම්කරු ක්ෂේත්‍රයට අදාල තවත් තොරතුරු සමගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන "Annual Employment Survey" ප්‍රකාශනය, එළි දක්වනු ලැබේ. උක්ත සමීක්ෂණයේ 2013 වර්ෂයට අදාල වාර්තාව මුද්‍රණය කර ඇති අතර 2014 වර්ෂයට අදාල වාර්තාව පිළියෙල කරමින් පවතී.

### 2.3.2 සාමාන්‍ය ඉපයීම් සහ වැඩ කරන කාලය පිළිබඳ සමීක්ෂණය

මෙම සමීක්ෂණය මගින් පඩි පාලක සභා ආඥා පනත යටතේ වේතන ලබන ආයතන වල පවතින සේවා තත්ව අනුව සේවකයින්ගේ ඉපැයීම් වල වෙනස්වීමේ ආකාරය විග්‍රහ කරනු ඇත. මෙහිදී පඩිපාලක සභා අනුව තෝරා ගත් ආයතන වලින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාසවලදී වර්ෂයකට දෙවරක් තැපැල් මාර්ගිකව තොරතුරු රැස් කරනු ලබන අතර එමගින් එක් එක් සේවා තත්ව අනුව ඉපැයීම් පිළිබඳ තොරතුරු රැස් කරනු ලැබේ. එම තොරතුරු වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන " The Survey on hours of actually worked and average earnings" මගින් එළි දක්වනු ලබන අතර එමගින් සේවා තත්ව අනුව ඉපයීම් රටාව විග්‍රහ කරනු ලැබේ.

### 2.3.3 පඩිපාලක සභා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම

පඩි පාලක සභා ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පඩිපාලක සභා අනුව නියම කරනු ලබන අවම වැටුප පදනම් කොට මාසිකව අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කරනු ලැබේ. මෙම දර්ශකාංකය කෘෂි(වැවිලි අංශය) කර්මාන්ත, වාණිජ, සේවා යන ප්‍රධාන අංශ සඳහා වෙන් වෙන්ව හා ඒකාබද්ධව ගණනය කරනු ලබන අතර එමගින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වල අවම වැටුප් මට්ටම් වල වෙනස්වීම් නිරීක්ෂණය කරනු ලැබේ. ඉහත දර්ශකය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු විවිධ ආයතන වලට මාසිකව, කාර්තුමය සහ වාර්ෂික මට්ටම් වලින් ලබා දෙනු ඇත. 2014 සෑම මාසයක් සඳහාම දර්ශකාංක පිළියෙල කරන ලදී.

කම්කරු සංඛ්‍යාති - 2013 වාර්ෂික ප්‍රකාශනය වෙබ් අඩවියට ඇතුලත් කර ඇති අතර එය මුද්‍රණය වෙමින් පවතී. මෙම අංශය මගින් දිවයිනේ පරිපාලන කොට්ඨාශ වල සීමාවන් අනුව කම්කරු දිස්ත්‍රික්ක කොට්ඨාශ බල සීමාවන් හඳුනාගෙන නිකුත් කරන ලද වාර්තාව කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර, හැකි ඉක්මනින් එය මුද්‍රණය කර කම්කරු කාර්යාල වෙත ලබා දීමට බලාපොරොත්තුවේ.

### 2.3.4 අධ්‍යාපන සංඛ්‍යාති

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කොට ඇති සංඛ්‍යාලේඛන අංශය මගින් වාර්ෂිකව සිදු කරන පාසැල් සංගණනයට සමගාමීව පුද්ගලික පාසැල්, පිරිවෙන්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳ තොරතුරු ද රැස් කරන ලදී. වාර්ෂිකව එළි දක්වන මූලික සංගණන වාර්තාව පිළියෙල කෙරෙමින් පවතින

අතර 2015 වසරේ පළමු කාර්තුව තුල එම දත්ත වෙබ් පිටුවේ පල කිරීම හා ප්‍රකාශන වලට අවශ්‍ය විශ්ලේෂිත අධ්‍යාපන දත්ත ලබා දීමට අපේක්ෂිතය.

2014 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ රජයේ පාසැල්, රජය අනුමත පුද්ගලික පාසැල් වල ගුරුවරුන්ගේ සහ පාසැල් සිසුන්ගේ පරිගණක සාක්ෂරතාව පිළිබඳ සමීක්ෂණය පැවැත්වූ අතර මේ වන විට ක්ෂේත්‍ර කටයුතු අවසන් වී ඇත. එම සමීක්ෂණයේ වාර්තාව 2015 වර්ෂයේ 2 වන කාර්තුව තුල ලබාදීමට බලාපොරොත්තු වේ.

මීට අමතරව දිවයිනේ පිහිටි සියළුම පාසැල් ඇතුලත් ලැයිස්තුව යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබන අතර අවශ්‍යතාවන් අනුව වෙනත් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, දේශීය හා විදේශීය දත්ත භාවිතා කරන්නන්ට විශ්ලේෂිත දත්ත ලබා දීමද කරනු ලැබේ.

## 2.3.5 වෛද්‍ය සංඛ්‍යාති

සෞඛ්‍ය අමාත්‍යාංශයේ පිහිටුවා ඇති වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මගින් රටපුරා විසිරී ඇති රජයේ රෝහල් පද්ධතිය මගින් දත්ත රැස් කරනු ලබන්නේ, අභ්‍යන්තර රෝගී හා මරණ, රෝගී ඇඳන්, සායන, බාහිර රෝගීන්, මාතෘ හා ළමා, මානව සම්පත්, විශේෂඥ වෛද්‍යවරුන්, දන්ත වෛද්‍යවරුන් හා ඊට අදාල දත්ත පිළිබඳව වන ආකෘති පත්‍ර එම ආයතන වෙත නිකුත් කර ඒවා සම්පූර්ණ කර ගෙන්වා ගැනීමෙනි. මෙම වැඩපිළිවෙල වර්ෂ 1960 පමණ සිට ක්‍රියාත්මක වන අතර අංශයට දත්ත පත්‍රිකා ලැබීම් ප්‍රතිශතය හා ප්‍රමාද වී ලැබීම ගැටළුවක්ව පැවතිණි. එබැවින් පුහුණු වැඩසටහන් පවත්වා අදාල නිලධාරීන් දැනුවත් කර 2014 වර්ෂයේ ලැබීම් ප්‍රතිශතය සතුටුදායක තත්වයකට පත් කිරීමට හැකි විය.

මෙම වර්ෂයේදී දත්ත විශ්ලේෂණය 2011, 2012 හා 2013 යන වසර තුනටම අදාලව සිදු කිරීමට අංශයට සිදු වූ අතර 2012 දත්ත විශ්ලේෂණය අවසන් කළ අතර 2011 දත්ත වලින් 50% ක් ද 2013 දත්ත වලින් 75% ක්ද විශ්ලේෂණය කර අවසන් කරන ලදී. 2014 වර්ෂය ආරම්භ වන විට 2009 සිට 2013 දක්වා වර්ෂ 5 සඳහාම වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයන්හි වැඩ කටයුතු නිම කිරීමේ අභියෝගයට මුහුණ දීමට සිදු වූ අතර 2014 වර්ෂය තුළ වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය - 2012 හා වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය - 2009/10 ප්‍රකාශයට පත් කිරීමට හැකි විය. 2011 හා 2013 වර්ෂ වලට අදාල වාර්තා පිළියෙල කරමින් පවතී.

2010 වර්ෂයේ හඳුන්වා දුන් eIMMR ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී රෝහල් වල ස්ථාපනය කිරීම ආරම්භ කළ අතර 2013 වර්ෂයේදී රෝහල් 98 ක් සාර්ථකව ස්ථාපනය කිරීමට හැකි විය. එමෙන්ම 2014 වර්ෂයේදී අළුතින් රෝහල් 75 ක් ඇතුලත් වූ අතර දැනට මෙම ව්‍යාපෘතිය රටපුරා රෝහල් 173 ක ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය ක්රියාත්මක කිරීම සඳහා ලෝක බැංකු ආධාර ලබා ගන්නා අතර ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය මෙම වර්ෂයේදී ආධාර සපයන ලදී.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ  කාර්යාල 26 ට හා අමාත්‍යාංශය වෙත ආයතන ලැයිස්තුව ලබා දී 2014 වර්ෂය සඳහා එම ලැයිස්තුව යාවත්කාලීන කරන ලද අතර 2014 වර්ෂය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ  කාර්යාල 26 හි eIMMR පද්ධති හඳුන්වා දීම සඳහා 2013 වර්ෂයේදී සිදු කල පුහුණු වැඩසටහන් වල සමාලෝචන වැඩසටහන් 26 ක් 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. ඒ සමඟම සෞඛ්‍ය දත්ත රැස් කිරීම හා එහි ඇති වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සඳහා දේශන මාලාවක් පශ්චාත් උපාධි ආයතන හා වෛද්‍ය පීඨ වල පවත්වන ලදී.

## 2.3.6 ජීව සංඛ්‍යාති

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන උපත්, විවාහ හා මරණ සංඛ්‍යාව හා ඊට අදාල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු හා මරණයට හේතු

යන දත්ත රැස් කොට එම තොරතුරු වාර්තා මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබයි.මේ වන විට 2010 වර්ෂයේ උපත් හා මරණ වලට අදාල දත්ත සැකසීමේ කටයුතු අවසන් කොට ප්‍රකාශයට පත් කොට ඇති අතර 2011 වර්ෂයට අදාල දත්ත පරිගණක ගත කිරීම අවසන් කර ඇත. 2012 සිට 2014 දක්වා වර්ෂ 03 සඳහා වූ දත්ත අදාල දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙමින් පවතී.

මීට අමතරව මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීමේ කටයුතු මෙම අංශය මගින් සිදු කෙරෙන අතර 2014 වර්ෂය සඳහා වයස් කාණ්ඩ සහ දිස්ත්‍රික් අනුව මධ්‍ය වාර්ෂික ජනගහනය සකස් කර දත්ත භාවිතා කරන්නන්ට ලබා දී ඇත. 2013 වර්ෂයට අදාල ජීව සංඛ්‍යාති දර්ශක (උදා : දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය, ජනගහන වර්ධන අනුපාතිකය ආදිය) සකස් කිරීම අවසන් කර ඇත.

## 2.3.7 ධීවර සංඛ්‍යාති

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශය මඟින් කරදිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, තොග සහ සිල්ලර මත්ස්‍ය මිල ගණන් සහ මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය හා අපනයනය පිළිබඳ දත්ත එක්රැස් කිරීම අවසන් කොට ධීවර සංඛ්‍යාති - 2014 ප්‍රකාශනය වෙබ් අඩවිය හරහා එළි දක්වා ඇත.

ඉන්දියානු සාගර ටූනා කොමිසමේ(IOTC) සහයෝගය මත කරදිය හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය යටතේ විශාල මත්ස්‍යයන් පිළිබඳ දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා වූ ව්‍යාපෘතියේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර මේ වන විට දත්ත රැස් කිරීමේ කටයුතු 50% ක් පමණ නිම කර ඇත. මීට අමතරව 2014 ජුනි මස සිට දෙසැම්බර් දක්වා වූ අයිස් නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු වාර්තාව මේ වන විට පිලියෙල කොට අවසන් වී ඇති අතර ටින් මාළු වෙළඳ පල පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ සමීක්ෂණයේ දේශීය ටින් මාළු නිෂ්පාදන ආයතන වලින් තොරතුරු ලබා ගැනීමේ කටයුතු අවසන් වී ඇත. ඉදිරියේදී ඒ පිළිබඳ වාර්තාවක් එළි දැක්වීමට බලාපොරොත්තු වේ.

## 2.3.8 රේගු සංඛ්‍යාති

ශ්‍රී ලංකා රේගුවේ සවයංක්‍රීය දත්ත සැකසුම් අංශයෙන් පරිගණක ගත කරන ලද ආනයන/අපනයන සම්බන්ධ දත්ත දිනපතාම ලබා ගැනීමත් බාහිර වෙළඳ සංඛ්‍යාති වලට අදාල තොරතුරු සකස් කිරීමත් ආනයන/අපනයන හා ප්‍රති අපනයන ලෙස දත්ත වෙන්කර ගොනු සකස් කිරීමත් දෝෂ සහිත දත්ත නිවැරදි කරමින් මාසික දෝෂ රහිත පරිගණක දත්ත ගොනු සකස් කිරීම හා සංඛ්‍යාන දත්ත අලෙවි අංශය කාර්යක්ෂමව පවත්වාගෙන යාමත් වගකීම් දරන ප්‍රධාන ක්ෂේත්‍ර වේ. බාහිර වෙළඳ සංඛ්‍යාති මාසිකව සකස් කර ඊළඟ මාසයේ මුල් දින 10 තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට,මහ භාණ්ඩාගාරයට,විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ,දේශීය හා විදේශීය ආයතන වලට හා පර්යේෂකයන්ට නිකුත් කර ඇත.

මේ වනවිට බාහිර වෙළඳ සංඛ්‍යාති - 2013 අර්ධ වාර්ෂික වාර්ථාව මුද්‍රණය කර ඇති අතර බාහිර වෙළඳ සංඛ්‍යාති - 2013 වාර්ෂික වාර්ථාව හා බාහිර වෙළඳ සංඛ්‍යාති - 2014 අර්ධ වාර්ෂික වාර්ථාව සකස් කරමින් පවතී.

# 3. පරිපාලනය

## 3.1 අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල

### 3.1.1 අංශ සහ ඒකක

පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15 කින් සහ ඒකක 2 ක් මගින් 2014 වසර තුල කාර්යයයන් මෙහෙය වන ලද අතර අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වේ.

| | |
|---|---|
| 1 වන අංශය | ජන සංගණන හා ප්‍රජා විද්‍යාත්මක |
| 2 වන අංශය | කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා |
| 3 වන අංශය | කෘෂිකර්මය හා පාරිසරික |
| 4 වන අංශය | ජාතික ගිණුම් |
| 5 වන අංශය | ප්‍රකාශන |
| 6 වන අංශය | පුස්තකාල හා ප්‍රලේඛන |
| 7 වන අංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |
| 8 වන අංශය | ආයතනික හා ගිණුම් |
| 9 වන අංශය | නියැදි සමීක්ෂණ |
| 10 වන අංශය | මුද්‍රණ |
| 11 වන අංශය | ක්ෂේත්‍ර කළමණාකරන |
| 12 වන අංශය | පුහුණු |
| 15 වන අංශය | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන |
| 16 වන අංශය | මිල හා වේතන |
| 18 වන අංශය | සිතියම් විද්‍යා |

LLRC සංගණන ඒකකය
දත්ත නිකුත් කිරීමේ ඒකකය
අභ්‍යන්තර විගණන අංශය

### 3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුල ශාඛා කාර්යාල 41 ක් පමණ පවත්වාගෙන යයි. මෙම ශාඛා කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේනඥවරයෙකු, සංඛ්‍යාලේනඥවරයෙකු, සංඛ්‍යාලේඛන නිලධාරීවරයෙකු හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරිවරයෙකු යටතේ පවතී.

### 3.1.3 දිස්ත්‍රික් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම එක් කාර්යාලයක් ද වේ. මෙම කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු හෝ සංඛ්‍යාලේඛනඥවරයෙකු භාරයේ පවතින අතර ඔහුට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරින් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ද අනුයුක්ත කොට ඇත.ඒ ඒ දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන වලට අදාලව දත්ත රැස් කිරීම මෙම කාර්යාල මගින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම දිස්ත්‍රික් කාර්යාල මගිනි.

### 3.1.4 පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

වෘත්තීය දක්ෂතා පෙන්වන සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරමින් පලාත් සභාවලට සංඛ්‍යාලේඛන සේවාව සැපයීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව කාර්ය මණ්ඩලය තාවකාලික පදනම මත මෙම දෙපාර්තමේන්තුවෙන් මුදා හැරීමෙන් පළාත් සභාවලට අනුයුක්ත කර ඇත. වඩාත් සුදුසු සංඛ්‍යානමය සම්බන්ධීකරණය, සංඛ්‍යාලේඛන ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලයේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙමඟින් තහවුරු කර ඇත. තාවකාලික මුදා හැරීම මගින් දෙපාර්තමේන්තුව මෙම නිලධාරීන් සැපයීමට පළාත් සභා සමඟ වැඩ සටහන් සම්පාදනය කරන ලදී.

## 3.2 කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව 2014 | 2014.12.31 දිනට සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංඛ්‍යාන) | 3 | 0 | 3 |
| 3 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 |
| 4 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන) | 1 | 0 | 1 |
| 5 | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 11 | 2 | 9 |
| 6 | අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | 0 |
| 7 | අධ්‍යක්ෂ (තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය) | 2 | 1 | 1 |
| 8 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ(සංඛ්‍යාන) | 34 | 9 | 25 |
| 11 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සංනිවේදන තාක්ෂණ - අධි සේවක) | 4 | 3 | 1 |
| 12 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය) | 6 | 0 | 6 |
| 13 | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) | 1 | 1 | 0 |
| 14 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවය) | 14 | 7 | 7 |
| 15 | ගණකාධිකාරී | 2 | 2 | 0 |
| 16 | අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 |
| 17 | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ * | 37 | 33 | - |
| 18 | සංඛ්‍යාලේඛනඥ | 200 | 101 | 66 |
| 19 | මුද්‍රණ කළමණාකරු | 1 | 0 | 1 |
| 20 | පද්ධති විශ්ලේෂක/වැඩ සටහන් සම්පාදක | 1 | 0 | 1 |
| 21 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 22 | සංඛ්‍යාලේඛන සැළසුම්කරු | 1 | 1 | 0 |
| 23 | පුස්තකාලාධිපති | 3 | 3 | 0 |
| 24 | භාෂා පරිවර්තක | 3 | 2 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි<br>2 පන්තිය II,I ශ්‍රේණිය | 6 | 0 | 6 |
| 26 | සංඛ්‍යාලේඛන නිලධාරී | 494 | 322 | 172 |
| 27 | සංඛ්‍යාලේඛන සහකාර * | 202 | 195 | - |
| 28 | සංවර්ධන නිලධාරි | 40 | 60 | -20 |
| 29 | අයවැය සහකාර | 1 | 1 | 0 |
| 30 | සිතියම් විද්‍යාඥ | 1 | 1 | 0 |
| 31 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර<br>3 පන්තිය III,II,I ශ්‍රේණිය | 147 | 147 | 0 |
| 32 | මුද්‍රණ නිමැවුම්කරු | 5 | 0 | 5 |
| 33 | මුද්‍රණ කාර්මික | 2 | 0 | 2 |
| 34 | කාර්මික නිලධාරි | 1 | 0 | 1 |
| 35 | පද්ධති පාලක | 2 | 2 | 0 |
| 36 | ජොෂ්ඨ පද්ධති ක්‍රියාකරු | 4 | 4 | 0 |
| 37 | වැඩ මූලික (මුද්‍රණ) | 1 | 0 | 1 |
| 38 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 170 | 121 | 49 |
| 39 | සහකාර දත්ත පාලක | 3 | 3 | 0 |
| 40 | දත්ත සටහන් ක්‍රියාකරු | 27 | 13 | 14 |
| 41 | දත්ත සටහන් ක්‍රියාකරු/කේත ලිපිකරු | 123 | 123 | 0 |
| 42 | ලිපිකරු (සිංහල මාධ්‍ය) | 10 | 10 | 0 |
| 43 | ලිපිකරු (දෙමළ මාධ්‍ය) | 20 | 17 | 3 |
| 44 | වෙරිටයිපර් හෙඩ්ලයිනර් | 1 | 1 | 0 |
| 45 | කැමරා ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 46 | පොත් බැඳුම්කරු(මුද්‍රණ) | 1 | 1 | 0 |
| 47 | ගිලටින් යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 48 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 49 | තහඩු සාදන්නා | 1 | 1 | 0 |
| 50 | යන්ත්‍ර පරිචාරක | 2 | 2 | 0 |
| 51 | ටයිප් සෙටර් | 1 | 1 | 0 |
| 52 | කොම්ටෝ මීටර් ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 53 | රියදුරු | 55 | 53 | 2 |
| 54 | වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 55 | මුද්‍රණ යන්ත්‍ර සහායක | 1 | 0 | 1 |
| 56 | කාර්යාල කාර්ය සහයක තනතුරු (ස්ථිර) | 107 | 90 | 17 |
| 57 | කාර්යාල කාර්ය සහයක තනතුරු (දෙපාර්තමේන්තුගත) | 10 | 10 | 0 |
| | **එකතුව** | **1774** | **1353** | **397** |
| | රියදුරු (අනියම්) | 3 | 0 | 3 |
| | **එකතුව** | **1777** | **1353** | **400** |

*   ඉදිරියට නව බඳවා ගැනීම් නොමැත

## 3.3 විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම - 2014

| | | |
|---|---|---|
| 1 | ඩබ්.ටී.පී.ජී.එන්.සී. වීරසිංහ මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 පෙබරවාරි 03 සිට 07 දක්වා ඉන්දියාවේ පැවති තොග / නිෂ්පාදන මිල දර්ශකය හා කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 2 | ඊ.එම්.සී.ද සේරම් මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 පෙබරවාරි 03 සිට 07 දක්වා ඉන්දියාවේ පැවති තොග / නිෂ්පාදන මිල දර්ශකය හා කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 3 | ආර්.එම්.අයි.කේ. රත්නායක මෙය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 පෙබරවාරි 03 සිට 07 දක්වා ඉන්දියාවේ පැවති තොග / නිෂ්පාදන මිල දර්ශකය හා කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 4 | එස්. ජෙයවිතාන් මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 පෙබරවාරි 03 සිට 07 දක්වා ඉන්දියාවේ පැවති තොග / නිෂ්පාදන මිල දර්ශකය හා කාර්මික නිෂ්පාදන දර්ශකය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 5 | පී.එච්.ජේ.කේ. ගුණතිලක මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 පෙබරවාරි 24 සිට 28 දක්වා පාකිස්තානයේ පැවති ශ්‍රම වෙළඳපල සංඛ්‍යා පිළිබඳ පුහුණු පාඨමාලාව |
| 6 | සුකාන්තානී දේවේන්ද්‍රන් මෙය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 පෙබරවාරි 24 සිට 28 දක්වා පාකිස්තානයේ පැවති ශ්‍රම වෙළඳපල සංඛ්‍යා පිළිබඳ පුහුණු පාඨමාලාව |
| 7 | ඩබ්.ඒ.සී. විජේබණ්ඩාර මෙය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 පෙබරවාරි 05 සිට 07 දක්වා තායිලන්තයේ පැවති ජාතික සමීක්ෂණ දත්ත මත පදනම් වූ ආහාර සුරක්ෂිතතා විශ්ලේෂණය පිළිබඳ කලාපීය වැඩමුළුව |
| 8 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2014 පෙබරවාරි 26 සිට මාර්තු 07 දක්වා ඇමරිකාවේ පැවති UN සංඛ්‍යාලේඛන කොමිසමේ 45 වන සැසිය |
| 9 | සුසන්තා රණධීර මිය<br>අධ්‍යක්ෂ | 2014 මාර්තු 25 සිට 26 දක්වා නේපාලයේ පැවති සාර්ක් රටවල සංඛ්‍යාලේඛන සංවිධානයන්ගේ ප්‍රධානීන්ගේ 6 වන සමුළුව (SAARCSTA) |
| 10 | කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 මාර්තු 19 සිට 21 දක්වා චීනයේ පැවති නවීකරණ සමීක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 11 | වයි.ජී.ආර්.අයි. කුලතිලක මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2014 මාර්තු 19 සිට 21 දක්වා චීනයේ පැවති නවීකරණ සමීක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 12 | අර්.ඩී.ජේ.යූ. රාජපක්ෂ මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2014 අප්‍රේල් 01 සිට 03 දක්වා ඉන්දුනීසියාවේ පැවති ආසියා ගිණිකොන දිග කොටස සඳහා වූ භූ විද්‍යාත්මක නාම පිළිබඳ එක්සත්ජාතීන්ගේ විශේෂඥයින්ගේ 2 වන සමුළුව |
| 13 | එස්.එච්. මන්සූර් මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 අප්‍රේල් 03 සිට 04 දක්වා පිලිපීනයේ පැවතිසමාජ ආරක්ෂක දර්ශකය යාවත්කාලීන කිරීම හා දියුණු කිරීම |
| 14 | එම්.ඩී.ඩී.ඩී. දීපවංශ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 අප්‍රේල් 03 සිට 04 දක්වා පිලිපීනයේ පැවතිසමාජ ආරක්ෂක දර්ශකය යාවත්කාලීන කිරීම හා දියුණු කිරීම |
| 15 | ඒ.එන්. ඒකනායක මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2014 මැයි 14 සිට 16 දක්වා කැනඩාවේ පැවැති සංස්කෘතික අංශයේ රැකියා නියුක්තිය පිළිබඳ යුනෙස්කෝ රටවල් සහභාගි වූ නියමු රැස්වීම |
| 16 | ඩී.එම්.කේ.පී.කේ. දිසානායක මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2014 අප්‍රේල් 16 සිට18 දක්වා චීනයේ පැවති කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සඳහා නූතන තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |

| | | |
|---|---|---|
| 17 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2014 අප්‍රේල් 08 සිට 10 දක්වා මලයාසියාවේ පැවති ආසියාව හා පැසිපික් කලාපය සඳහා නියෝජිතායතන ප්‍රධානීන්ගේ 03 වන රැස්වීම |
| 18 | යූ.ඩී. ජයකොඩි මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 අප්‍රේල් 07 සිට 11 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති ජනගහනය හා සංවර්ධනය පිළිබඳ කොමිසමේ 45 වන සැසිය |
| 19 | ඩබ්.පී.එස්. සිසිලරත්න මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 ජූනි 09 සිට 12 දක්වා චීනයේ පැවති භූගෝලීය සංඛ්‍යාන තොරතුරු වැඩි දියුණු කිරීමේ ජාත්‍යාන්තර වැඩමුළුව |
| 20 | ඩබ්.එච්.පී.ඩබ්. වීරසිරි මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 ඔක්තොම්බර් 27 සිට නොවැම්බර් 07 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති අතරමැදි භාවිතා කරන්නන් සඳහා වැඩමුළුව (සංගණන හා සමීක්ෂණ සැකසීමේ පද්ධතිය) |
| 21 | ජී.ඩී.ඩී. ප්‍රියන්ත මයා<br>සහකාර අධ්‍යක්ෂ | 2014 ඔක්තොම්බර් 27 සිට නොවැම්බර් 07 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති අතරමැදි භාවිතා කරන්නන් සඳහා වැඩමුළුව (සංගණන හා සමීක්ෂණ සැකසීමේ පද්ධතිය) |
| 22 | අයි.ඒ.එන්. ප්‍රනාන්දු මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 ඔක්තොම්බර් 27 සිට නොවැම්බර් 07 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ පැවති අතරමැදි භාවිතා කරන්නන් සඳහා වැඩමුළුව (සංගණන හා සමීක්ෂණ සැකසීමේ පද්ධතිය) |
| 23 | යූ. මහේෂ්වරන් මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 ජූනි 11 සිට 12 ඔස්ට්‍රියාවේ පැවති කාර්මිකරණය සඳහා 20 වසරක සංඛ්‍යාන වැඩමුළුව |
| 24 | ජේ.එම්.එස්.යූ.බී. ජයන්ත මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 ජූනි 05 සිට 11 දක්වා සෙනගාල්හි පැවති සමීක්ෂණ නිර්මාණ වැඩමුළුව |
| 25 | ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 ජූනි 16 සිට 17 දක්වා ඉන්දියාවේ පැවති සිවිල් ලියාපදිංචිය හා ජීව සංඛ්‍යාති පිළිබඳ තාක්ෂණික සාකච්ඡාව |
| 26 | කේ.ඒ. සජීවා කොඩිකාර මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 නොවැම්බර් 03 සිට 14 දක්වා කොරියාවේ පැවති සංඛ්‍යානමය ධාරිතාව පුළුල් කිරීම සඳහා පුහුණු වැඩසටහන |
| 27 | එස්.ඒ.එස්. බන්දුලසේන මයා<br>අධ්‍යක්ෂ | 2014 දෙසැම්බර් 15 සිට 22 දක්වා ජපානයේ පැවති ක්ෂුද්‍ර දත්ත භාවිතය - 6 වන ජාත්‍යාන්තර සමුළුව |
| 28 | එච්.ඩබ්.එම්. ජයවීර මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 දෙසැම්බර් 15 සිට 22 දක්වා ජපානයේ පැවැති ක්ෂුද්‍ර දත්ත භාවිතය පිළිබඳ 6 වෙනි ජාත්‍යාන්තර වැඩමුළුව |
| 29 | ඒ.කේ.එම්. කෞශල්‍යා මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2014 අගොස්තු 04 සිට 05 දක්වා ඇමෙරිකාවේ පැවැති සංඛ්‍යාන හා භූගෝලීය තොරතුරු වැඩි දියුණු කිරීමේ ගෝලීය වැඩමුළුව |
| 30 | ඩබ්.ඒ.බී. වෙහෙරගොඩ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2014 ඔක්තොම්බර් 19 සිට 31 දක්වා මැලේසියාවේ පැවති අධ්‍යයන චාරිකාව |
| 31 | ආර්.ඒ.සී. ගුණවර්ධන මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 අගෝස්තු 28 සිට 29 දක්වා තායිලන්තයේ පැවති සිවිල් ලියාපදිංචිය හා ජීව සංඛ්‍යාති පිළිබඳ අමාත්‍ය සමුළුව සඳහා කලාප රැස්වීම |
| 32 | ඒ.ඩී.සී. චමිලප්‍රේමි මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2014 අගෝස්තු 27 සිට 28 දක්වා වියට්නාමයේ පැවති පොදු දත්ත නිකුත් කිරීමේ පද්ධතියක් යටතේ දත්ත නිකුත් කිරීම දියුණු කිරීම සඳහා වැඩමුළුව |

| | | |
|---|---|---|
| 33 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2014 ඔක්තොම්බර් 01 සිට 02 දක්වා මොන්ගොලියාවේ පැවති සංඛ්‍යාවල තත්ව රාමුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ලෝක සමුළුව |
| 34 | එස්. තනබාලසිංහම් මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2014 සැප්තැම්බර් 02 සිට 04 දක්වා ජපානයේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාති සම්බන්ධීකරණය සඳහා ආසියා හා පැසිපික් ජාල පිළිබඳ6 වන සංඛ්‍යාන පුහුණුව |
| 35 | එස්.ඒ.එස්. බන්දුලසේන මයා<br>අධ්‍යක්ෂ | 2014 සැප්තැම්බර් 15 සිට 19 දක්වා කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන කළමනාකරන හා සේවා පද්ධතිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය |
| 36 | පී.එම්.ආර්. ප්‍රනාන්දු මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 සැප්තැම්බර් 15 සිට 19 දක්වා කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන කළමනාකරන හා සේවා පද්ධතිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය |
| 37 | කේ.එම්.ආර්. වික්‍රමසිංහ මයා<br>සහකාර අධ්‍යක්ෂ | 2014 සැප්තැම්බර් 15 සිට 19 දක්වා කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන කළමනාකරන හා සේවා පද්ධතිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය |
| 38 | කේ.එල්.සී.එස්. වීරසූරිය මයා<br>සහකාර අධ්‍යක්ෂ | 2014 සැප්තැම්බර් 15 සිට 19 දක්වා කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන කළමනාකරන හා සේවා පද්ධතිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය |
| 39 | එම්.එස්.එස්. සුමනපාල මිය<br>සහකාර අධ්‍යක්ෂ | 2014 සැප්තැම්බර් 15 සිට 19 දක්වා කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන කළමනාකරන හා සේවා පද්ධතිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය |
| 40 | චාන්දනී විජේබණ්ඩාර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 සැප්තැම්බර් 15 සිට 19 දක්වා කොරියාවේ පැවති ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන කළමනාකරන හා සේවා පද්ධතිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය |
| 41 | ඩබ්.පී.එස්. සිසිලරත්න මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 ඔක්තොම්බර් 27 සිට 29 දක්වා ජපානයේ පැවති ආපදා සම්බන්ධ ආසියා හා පැසිපික් සංඛ්‍යා පිළිබඳව තාක්ෂණික උපදේශකයින් සඳහා 01 වන රැස්වීම |
| 42 | සී.එස්. ලියනගේ මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2014 සැප්තැම්බර් 29 සිට ඔක්තොම්බර් 10 දක්වා ඉන්දුනීසියාවේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාතීන් සඳහා ප්‍රධාන දත්ත සැපයීමේ නියැදි ක්‍රම |
| 43 | ජී.කේ.ඩී.එච්. මැණිකේ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 සැප්තැම්බර් 29 සිට ඔක්තොම්බර් 10 දක්වා ඉන්දුනීසියාවේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාතීන් සඳහා ප්‍රධාන දත්ත සැපයීමේ නියැදි ක්‍රම |
| 44 | යූ.එම්.එම්.අයි. ප්‍රේමරත්න මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 ඔක්තොබර් 27 සිට 30දක්වා කොරියාවේ පැවැති සංඛ්‍යාන දත්ත හා පාර දත්ත හුවමාරුව පිළිබඳ 7 වන OECD කණ්ඩායම් රැස්වීම |
| 45 | එන්.ඩබ්. දිසානායක මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 ඔක්තොම්බර් 13 සිට 17 දක්වා ඉන්දියාවේ පැවති මහජන සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 46 | ඩබ්. සිරිවර්ධන මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 ඔක්තොම්බර් 13 සිට 17 දක්වා ඉන්දියාවේ පැවති මහජන සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 47 | ඕ.ආර්. විජේගුණසිංහ මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 ඔක්තොම්බර් 13 සිට 17 දක්වා ඉන්දියාවේ පැවති මහජන සෞඛ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 48 | යූ.එස්. වනපුෂ්ප මයා<br>නියොජ්‍ය අධ්‍යක්ෂ | 2014 නොවැම්බර් 03 සිට 06 දක්වා ඉන්දියාවේ පැවති ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යා පිළිබඳ කලාපීය සමුළුව |

| | | |
|---|---|---|
| 49 | කේ.ජී. තිලකරත්න මයා<br>අධ්‍යක්ෂ | 2014 නොවැම්බර් 27 සිට 28 දක්වා ඉන්දියාවේ පැවති සංඛ්‍යාන තත්ව පාලනය හා නිල සංඛ්‍යාලේඛන වල මූලික මූලධර්ම පිළිබඳ 07 වන කලාපීය පාඨමාලාව |
| 50 | ඩී.සී.ඒ. ගුණවර්ධන මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2014 නොවැම්බර් 11 සිට 12 දක්වා තායිලන්තයේ පැවති ආසියා පැසිපික් පර්යේෂණ න්‍යාය පත්‍රය පිළිබඳව ජාත්‍යන්තර වැඩසටහන |
| 51 | කේ.ආර්.එල්.එස්. සේනාධීර මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 නොවැම්බර් 11 සිට 12 දක්වා තායිලන්තයේ පැවති ආසියා පැසිපික් පර්යේෂණ න්‍යාය පත්‍රය පිළිබඳව ජාත්‍යන්තර වැඩසටහන |
| 52 | කේ.ටී. සුරේෂ්කුමාර් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 නොවැම්බර් 02 සිට 07 දක්වා ඉන්දියාවේ පැවති සාර්ක් සංවර්ධන අභිමතාර්ථ ලඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ වැඩසටහන |
| 53 | කේ.ජී. තිලකරත්න මයා<br>අධ්‍යක්ෂ | 2014 නොවැම්බර් 25 සිට 26 දක්වා යුරෝපා සංගමය අනුග්‍රහයෙන් ඉන්දියාවේ පැවැති ජාතික ගිණුම් හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුව |
| 54 | ජේ.පී.එම්. මෙනුරි මෙය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2014 දෙසැම්බර් 01 සිට 03 දක්වා තායිලන්තයේ පැවති අපරාධ සංඛ්‍යාතීන් හා වින්දිතයන් වීම පිළිබඳ සමීක්ෂණය සම්බන්ධ කලාපීය රැස්වීම |
| 55 | ඩී.ඩී.ජී.ඒ. සෙනෙවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2014 නොවැම්බර් 24 සිට 28 දක්වා තායිලන්තයේ පැවති සිවිල් ලියාපදිංචිය හා ප්‍රධාන සංඛ්‍යාතීන් පිළිබඳ අමාත්‍ය සමුළුව |
| 56 | එම්.ජී. පෙරේරා මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2014 නොවැම්බර් 17 සිට 19 දක්වා චීනයේ පැවති ශ්‍රම බලකාය හා ඉපයීමේ සංඛ්‍යාතීන් පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 57 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2014 නොවැම්බර් 13 සිට 14 දක්වා තායිලන්තයේ පැවති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාලේඛන වැඩිදියුණු කිරීම සඳහා වූ ආසියා හා ශාන්තිකර කලාපීය 3 වන ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම |
| 58 | ජයසම්පත් ලියනගේ මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2014 නොවැම්බර් 24 සිට 28 දක්වා ඉන්දුනීසියාවේ පැවති තිරසාර කෘෂිකර්මය ආහාර සුරක්ෂිතතාව හා දුගී බව නැති කිරීම සඳහා වගකීම වැඩි කිරීම ගණනය කිරීම |
| 59 | එස්.ටී.එස්. ගවේශිකා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 දෙසැම්බර් 09 සිට 12 දක්වා ජපානයේ පැවති සංඛ්‍යාතීන් වැඩි දියුණු කිරීම සඳහා ජාතික උපක්‍රම පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව |
| 60 | ඩබ්.ඩබ්.එම්.ඒ.එස්. ප්‍රේමකුමාර මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2014 දෙසැම්බර් 16 සිට 18 දක්වා වියට්නාමයේ පැවති NPO සඳහා ඵලදායිතාව විශ්ලේෂණය සඳහා වූ පර්යේෂණාත්මක වැඩමුළුව |
| 61 | යූ.එල්.කේ. පෙරේරා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2014 දෙසැම්බර් 02 සිට 04 දක්වා සීෂෙල්ස්හි පැවති දත්ත එකතු කිරීම හා සංඛ්‍යානය පිළිබඳ 10 වන වැඩමුළුව |

## 3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්

**උසස් කිරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛනඥ | 41 |

**පත් කිරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 22 |

**මුදාහැරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 03 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 01 |

**සේවය අතහැරයෑම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 02 |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර | 02 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 01 |

**විශ්‍රාමයෑම්**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 02 |
| සංඛ්‍යාලේඛනඥ | 07 |
| මුද්‍රණ කළමණාකරු | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 01 |
| රියදුරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

**ස්ථාන මාරු**

| | |
|---|---|
| සංවර්ධන නිලධාරි | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර | 08 |
| රියදුරු | 05 |
| කාර්යාල කාර්ය සහායක | 18 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 02 |

## 3.5 අභ්‍යන්තර විගණන කටයුතු

2014 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩ සටහන පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යොමු කරන ලද අතර 2014 වසරේ කාර්තු හතර සඳහා ප්‍රගතිය සහ විගණන විමසුම් පිළිබඳව විගණන කළමනාකරණ රැස්වීම් පවත්වා එම කරුණු මත වාර්තාව පිළියෙළ කොට අදාල අංශ වෙත යවන ලදි .

අධක්ෂ ජනරාල් තුමා විසින් වාචිකව හා ලිඛිතව දැනුම් දුන් ආකාරයට දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ නිවාඩු පිළිබඳ පරීක්ෂාවක් කරන ලද අතර කාර්යාල සේවක නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු පරීක්ෂා කර වැටුප් වැඩිවීම් නියෝග පත්‍ර, කාර්ය සාධන වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු යෙදවීම සහ වැන්දඹු අනත්දරු දායකත්ව අංක ලබා දීමට ද කටයුතු සලසන ලදී. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාල දෙකක් අහඹු ලෙස තෝරා ගෙන එම කාර්යාල වල සාමාන්‍ය පරිපාලනය හා කාර්යය පරීක්ෂා කර ඒ පිළිබඳ වාර්තාවක් සකස් කල අතර 2014 වර්ෂයේ මාස කිහිපයක වව්චර්පත් හා බැංකු සැසැඳුම් පරීක්ෂා කර බලා එමඟින් හෙළිදරව් වන අඩුපාඩු ද පෙන්වා දෙන ලදී.

දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය වර්ෂයට දෙවරක් විගණන පරීක්ෂාවකට ලක් කළ අතර එහි අඩුපාඩු පෙන්වා දී නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී. දෙපාර්තමේන්තුව සතු කුලියට ලබාගත් කාර්යාල පරිශ්‍රවල තිබූ භාණ්ඩ හා උපකරණ වල වසර අවසාන කාලය වනවිට තිබූ සත්‍ය තත්වය පිළිබඳව ද බත්තරමුල්ල ගබඩා අංශයේ නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛන හා ආර්ථික සංගණනයේ දිස්ත්‍රික් කාර්යාලවල සිට ගෙන එනු ලබන සංගණන හා සාරාංශ ලේඛන පිළිබඳව ප්‍රගතිය ද පරීක්ෂා කර බලා වාර්තා කරන ලදී.

දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් B ගිණුම, විගණන නියැදි පරීක්ෂාවකට හා පොදු තැන්පත් ගිණුම විගණන පරීක්ෂාවකට ලක්කොට ඒවායේ තිබූ වැරදි හා අඩුපාඩු අනාවරණය කරන ලදී. එමෙන්ම වැටුප් ලෙජර නියැදි පරීක්ෂාවකට භාජනය කළ අතර වැටුප් පාලන ගිණුමක් සකස් කළ යුතු බවට උපදෙස් දෙන ලදී.

## 4. මූල්‍ය වාර්තාව - 2014

2014 වර්ෂය සඳහා අදාල සීමාවන් යටතේ වන මුළු ඇස්තමේන්තුගත වියදම රු.1,994,789,000 (මිලියන 1,994.78) කි. මේ අතරින් රු. 683,900,000 (මිලියන 683.9) ක් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වන අතර රු. 1,310,889,000 ක් (මිලියන 1,310.88) ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු වේ. "පුනරාවර්තන වියදම් 2014" වගුව අනුව සත්‍ය වශයෙන් දරන ලද පුනරාවර්තන වියදම රු. 673,168,299 (මිලියන 673.16) ක් වේ. "ප්‍රාග්ධන වියදම් 2014" වගුවෙහි දක්වා ඇති පරිදි සත්‍ය වශයෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. 1,284,887,463 (මිලියන 1,284.88) කි.

පුනරාවර්තන වියදම්: ඇස්තමේන්තු වියදම හා සත්‍ය වියදම අතර වෙනස

ඉහත වර්ගකිරීම් යටතේ ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සුළු වෙනසක් දැකිය හැකි අතර ඊට හේතු පහත දැක්වේ.

- වවුචර වර්ෂය තුළ ගෙවීමට ඉදිරිපත් නොවීම
- නඩත්තු වියදම අඩුවීම
- ඉන්ධන මිල ගණන් අඩුවීම

ප්‍රාග්ධන වියදම්: ඇස්තමේන්තු වියදම හා සත්‍ය වියදම අතර වෙනස

- අළුත්වැඩියා වියදම් අවම වීම
- වවුචර ප්‍රමාද වී ඉදිරිපත් කිරීම

| | | |
|---|---|---|
| ශීර්ෂය | : | 252 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | : | 01 මෙහෙයුම් වැඩ සටහන |
| ව්‍යාපෘතිය | : | පරිපාලනය සහ සංඛ්‍යානමය සේවා |

**පුනරාවර්තන වියදම් 2014**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2014 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2014 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. පුද්ගලික පඩිනඩි | 509,100,000 | 508,124,610 |
| | 2. වෙනත් පුනරාවර්තන වියදම් | 174,800,000 | 165,043,689 |
| | **එකතුව** | **683,900,000** | **673,168,299** |

**ප්‍රාග්ධන වියදම් 2014**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2014 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2014 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | 12,000,000 | 9,128,631 |
| | 2. මූලධන වත්කම්වල අත්පත් කර ගැනීම | 413,960,000 | 413,880,189 |
| | වෙනත් මූලධන වියදම් | 884,929,000 | 861,878,643 |
| | **එකතුව** | **1,310,889,000** | **1,284,887,463** |

**ර.නි.අ.බි. ගිණුම 25201 – 2014**

| | අනුමත සීමාව රුපියල් | සත්‍ය සීමාව රුපියල් |
|---|---|---|
| උපරිම හර සීමාව | 44,000,000 | 41,916,870.44 |
| උපරිම බැර සීමාව | 25,000,000 | 34,988,158.40 |
| හර ශේෂයේ උපරිම සීමාව | 250,000,000 | 138,284,062.70 |